
අවසන් අඹ වාරය
The Last Season of Mango
Written by - G.M.C.S. Wijerathne
කර්තෘ- චමෝද් සචේතන විජේරත්න

කෘතියේ නම-අවසන් අඹ වාරය

කර්තෘගේ නම-චමෝද් සචේතන විජේරත්න

කෘතිය පළ කරන දිනය-2025-02-08
*(විද්‍යුත් පොතක් ලෙස)*

කතෘගේ වෙනත් කෘති- *කෙටි කතා*
■පුංචි බලු පැටියෙකුගේ කතාව
■මියුරු සංගීතඥයා

**ISBN 978-624-208-735-1**

# පිදුම

## මෙතෙක් කල් අකුරු කෙරූ

## සියලු ගුරුවරුන්ට

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය හික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අහිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


| පරිච්ඡේදය | පිටු අංකය |
| --- | --- |
| අඹ ගස | 07 |
| අමුත්තා | 12 |
| පෙර සූදානම | 17 |
| චොක්ලට් පෙත්ත | 22 |
| අලුත් තෑග්ග | 27 |
| රැස්වන කුණාටුව | 32 |
| දළදා පෙරහැර | 38 |
| පන්සලට යාම | 45 |
| උපන් දිනය | 51 |
| අවසන් අඹ වාරය | 57 |



නදීන් අඹ ගස අසලට වී බලා සිටින්නට විය. “තව ම නැහැනේ. දැන් කොච්චර වෙලා ගියා ද? තව ම නැහැ නොවැ” නදීන් බලා සිටින්නේ තමාගේ මිතුරා චතුර පැමිණෙන තුරු ය.

# 1
# අඹ ගස

නදීන් අඹ ගස අසලට වී බලා සිටින්නට විය. " තව ම නැහැනේ. දැන් කොච්චර වෙලා ගියා ද? තව ම නැහැ නොවැ" නදීන් බලා සිටින්නේ තමාගේ මිතුරා චතුර පැමිණෙන තුරු ය. නමුත් නදීන් සිතන තරම් වෙලාවක් ගත වී නොමැත. උපරිමයෙන් ගත වන්නට ඇත්තේ මිනිත්තු 10කි. නමුත් අද දින නදීන්ට එය වැඩියෙන් දැනෙන්නට ද එක් විශේෂ හේතුවක් විය. නදීන් චතුර එන තුරු බලා සිටින්නේ ද එය කියන්නට ම ය.

නදීන් යනු අවුරුදු 10ක් වයැසැති ළමයෙකි. එතරම් දක්ෂතා අතර නොසිටිය ද සොබහව දහමට ඉතා ඇලුම් කළේ ය. මහනුවරට ආසන්න කුඩා ගමක ජීවත් වූ නදීන්ගේ පවුලේ එක ම දරුවා වූ නදීන්ට දෙමාපියන්ගෙන් ලැබුණේ නොමද ආදරයකි. නදීන්ගේ පියා කලින් අසල තේ වත්තක කම්කරුවෙකි. කොතරම් වෙහෙස වී වැඩ කළ ද නදීන්ගේ පියාට ලැබුණේ සොච්චම් වැටුපකි. ඒ නිසා ම නදීන්ගේ මව තේ වත්ත අසල කුඩා තේ කඩයක් පවත්වාගෙන ගියා ය. තේ වත්තෙහි වැඩ කරන සියලු කම්කරුවෝ තේ උගුරක්, කෝපි උගුරක් බීමට පැමිණියේ නදීන්ගේ මවගේ කඩයට ය. කිසිඳු වංචාවක් නොකළ බැවින් නදීන්ගේ මවගේ තේ කඩයෙන් බොහෝ වාසි අත් විය. එම නිසා ම ඇය කුඩා සිල්ලර කඩයක් ආරම්භ කළා ය. එහි මුදලාලි වූයේ නදීන්ගේ පියා ය. දැන් එය ගමෙහි විශාල ම කඩය බවට පත් වී තිබේ.නමුත් නදීන්ගේ මව

තවමත් තේ කඩය පවත්වාගෙන යයි.

නදීන්ගේ හොඳ ම මිතුරා චතුර ය. චතුරගේ පියා ගොවියෙකි. මව ගෘහණියකි. දෙමව්පියන්ට උදවු කරමින් නිවසේ කටයුතු සමබර ව පවත්වාගෙන යාමට දක්ෂ නදීන් උදෑසන කාලයේ දී සියලු කටයුතු නිම කර සවසට අඹ ගස අසලට එන්නේ නදීන් සමඟ කාලය ගත කිරීමට ය. නදීන් මෙන් ම පවුලේ එකම දරුවා වූ නදීන්ට ද දෙමව්පියන්ගෙන් හිමිවන්නේ නොමද ආදරයකි. නදීන් මෙන් ම පරිසරයට ආදරය කළ චතුර ඉගෙනීමට ද දක්ෂයෙකු විය. පන්තියේ දක්ෂත ම ළමයා වූ චතුර කිසිඳු අමතර පන්තියකට සහභාගී වූයේ ද නැත. නදීන්ට ද නොදන්නා දේ කියාදෙන චතුර නදීන් ඉගෙනීමට උනන්දු කළේ ය. එමෙන් ම චතුරගේ පවුලේ තවත් විශේෂ අයෙකු විය. ඒ චතුරගේ ආච්චී ය. ආච්චිගෙන් කතා ඇසීමට දෙයහළුවෝ සමහර දිනක චතුරගේ නිවසට යති. ආච්චි රස කතා වැල් ගෙන දක්වන විට හූමිටි තැබීම චතුරගේ හා නදීන්ගේ සිරිත ය. දෙදෙනාට හූමිති තැබීමට අමතක වූ විට."කෝ හූමිටි තියපල්ලා" යැයි ආච්චි දෙදෙනා උනන්දු කරයි. චතුරගේත් නදීන්ගේත් මිතුදම කුඩාකල සිටන් ම පැවතගෙන එන්නකි. තවමත් නොකැඩී පවතින මෙම මිතුදම ඉතා අගනේ ය.

නමුත් චතුරට වඩා නදීන්ට සමීප අයෙකු ඇත. එනම් නදීන්ට පිටුපසින් ඇති මේ අඹ ගසයි. නදීන්ට දුකක් ඇති වූ විට නදීන් පළමු ව දිව යන්නේ මේ අඹ ගස අසලට යි. එමෙන් ම සතුටක දී ද නදීන් පළමුව දිව යන්නේ අඹ ගස දෙසටයි. අඹ ගස දැන් පසුවන්නේ මහළු වියේ ය. 'මේ මහල්ලා කී දෙනෙක්ගේ නම් සාගිනි නිවන්නට ඇත් ද?' නදීන්ට සිතෙන්නට විය.

නදිට වුව ද කඩචෝරු ගන්නා කඩ වසා තැබූ විට, කඩචෝරු ගැනීමට මුදල් නැති වූ විට කෑමට අඹ ගෙඩියක් ලබා දෙන්නේ මේ අඹ ගසය. අඹ ගස හා නදින් අතර පවතින්නේ දිගු බැඳීමකි. නදින්ට පමණක් නොව නදින්ගේ පියාට ද මේ සමඟ විශාල බැඳීමක් ඇත. මෙම අඹ ගස සිටවා තිබෙන්නේ නදින්ගේ සීයා, එනම් නදින්ගේ පියාගේ පියා විසිනි. ඒ තම තාත්තාගේ උපන් දිනයට ය. නදින්ගේ පියා ද නදින්ගේ සෑම උපන් දිනයකට ම අඹ පැළයක් සිටුවයි. නදින්ගේ පියා කඩයට යාමට පෙර අඹ ගස්වලට සාත්තු කිරීම සිරිතකි.

ඔව්. නදින්ට කෙමෙන් කෙමෙන් ඉදිරියට ඇදී එන අයෙකුගේ සිරුර පෙනෙන්නට විය. "නිසැක ව ඒ චතුර විය යුතු ය" නදින්ගේ සිතුවිල්ල නිවැරදි ය. නදින්ගේ සතුට ඉහවහා යන්නට විය. චතුර නදින් සමීපයට පැමිණියේ ය.

"යමු. යමු" චතුරගේ හඬත් සමඟ දෙදෙනාම අඹ ගස දිගේ ඉහළට බඩගාන්නට විය. නදින් හා චතුරගේ රහස් සියල්ල බෙදා ගත් ස්ථානය මෙයයි. දෙදෙනාට ම වෙන් කරගත් අතු දෙකක වාඩි වී දෙදෙනාට ම ආවේණික සොඳුරු කතාබහක නිරත වීම මෙම දෙදෙනාගේ පුරුද්දයි. මෙම අඹ ගසෙහි සැඟවුණු මිහිරි මතකයන් රැසකි. ඒවා යලි යලිත් ආවර්ජනය කිරීම සැබැවින් ම සිතට සතුට ගෙන දෙන්නකි.

දෙදෙනා ම හිමින් හිමින් ගසෙහි මුදුනට ළඟා විය.

"චතුර, මට ඔයාට කියන්න වැදගත් ආරංචියක් තියෙනවා" ගසෙහි මුදුනට ළඟා වූ නදින් පැවසීය.

"මොකද්ද ඒ" චතුර පුදුමයෙන් ඇසීය.

“චතුර මම ශිෂ්‍යත්වෙ සමත් වෙලා” අත්තෙහි වොඩි වූ සැණින් නදීන් හඬ නගා කීය.
“ඇත්ත ද? හරි ම සතුටුයි නදීන්. මම නම් හිතුවෙ නැහැ ඔයා හිටපු විදියට සමත් වෙයි කියලා. කම්මැලි පරිසරවේදියා” චතුර කියූ දෙයට දෙදෙනාටම සිනහා ගියේ ය.
“හැම දේම ඔයා නිසා චතුර. ඉතින්, ඔයාගේ ලකුණු කොහොම ද?” නදීන් පැවසී ය. සැබැවින් ම චතුර නොවන්නට නදීන් ශිෂ්‍යත්ව විභාගය අසමත් වීමට ඉඩ තිබුණි. නදීන් එයට චතුරට බොහෝ සේ කෘතඥ විය.
“තාම පියුන් මාමා ආවේ නෑ. තව ටිකකින් එයි” චතුර පිළිතුරු දුන්නේ ය.

ඒ ටිකෙන් ටික තාක්ෂණය දියුණු වන, ගමට තාක්ෂණය ටිකෙන් ටික ළඟා වන, පියුන් මාමා තවමත් ශිෂ්‍යත්ව ලකුණු රැගෙන නිවසට පැමිණෙන සරල අවධියක් විය. නමුත් මෙය ළඟදීම වෙස්වන බව ඔවුන් නොදත්තේ ය.

දෙදෙනාම සතුටින් කතා බහ කර සතුටින් කාලය ගත කරන්නට විය. දෙදෙනා විහිළු කරන්නට විය. සිනාසෙන්නට විය. අඹ ගසේ අනාගතය ගැන කතා කරන්නට විය. අඹ වගාව ගැන කතා කරන්නට විය. සෙල්ලම් කරන්නට විය. මේ අතර,
“පුතේ... මගෙ පුතේ...” යනුවෙන් හඬක් ඇසෙන්නට විය.
“තාත්තා” චතුරට ඒ හඬ වරදින්නට බැරි ය.
“මම පරක්කු වෙලා වගේ. ඒත් මට නම් හිතෙන්නේ නෑ මම ඒ තරම් පරක්කුයි කියලා. එහෙනම් මම යනවා” කියූ චතුර ගසෙන් බැස ගියේ ය.

මේ ගමනින් ඇරඹි සිදුවීම් දාමය හේතුවෙන් මෙම දෙමිතුරන් යලි එක් නොවනු ඇති බව කිසිවෙකු සිහිනෙකිඳු නොසිතන්නට ඇත. කාලය වේගයෙන් ගත වන බව නදීන්ට දැනෙන්නට විය. නදීන්ට ඉදිරියේ දී තම ජීවිතිය ගැන බොහෝ තීරණ ගත යුතුව ඇත. අවසානයට,

නදීන් ගස උඩ තනි විය.

# 2
# අමුත්තා

චතුර සෙමෙන් සෙමෙන් අඹ ගසින් බසින්නට විය. චතුරගේ පියා අඹ ගස පහළට වී චතුර පැමිණෙන තුරු බලා හිඳින්නට විය.
"අනේ සමාවෙන්න තාත්තේ. මට දැනුණෙ නෑ එච්චර වෙලා ගියා කියලා. නැත්තම් මම එනවා"
ගසෙන් පහළට බැසගත් චතුර කීය.
"නැහැ නැහැ. පුතා පරක්කු නෑ. අපි ගෙදර යංකෝ"
චතුරගෙ පියා සරත් කීවේ ය.
"ඇයි තාත්තේ. මොකද?" චතුර කුතුහලයට පත්ව ඇසීය.
"යංකෝ. පොඩි හදිස්සියක්." පියාගේ වචනත් සමඟ චතුරගේ කුතුහලය බියක් බවට පරිවර්තනය වන්නට විය.

චතුර බිය වූයේ තම ආච්චි පිළිබඳව ය. වයස අවුරුදු 80කට නොඅඩු වූ ඇය දක්ෂ කතාකාරියක් වූවා ය. නමුත් ඇගේ හතිය, අධික රුධිර පීඩනය වැනි රෝගය තත්වයන් නිසා ඇගේ ජීවිතය අවිනිශ්චිත විය. චතුර බිය වූයේ ඒ පිළිබඳව ය. තම ආච්චි අහිමි වීම තමාට දරාගත නොහැකි බව ඔහුට වැටහුණේ ය. නමුත් තව ම එය අවිනිශ්චිතය. එම නිසා ඔහු තම හැඟීම් පාලනය කර ගැනීමට උත්සාහ කළේ ය.
"පුතේ පොඩ්ඩක් නවතින්න" චතුරට ඈතින් කටහඬක් ඇසෙන්නට විය. චතුර හැරී බැලුවේ ය. චතුර තම සිතිවිලි සමඟ බොහෝ දුර ගමන් කර තිබුණි.
"පුතා හරි ඉක්මන්කාරයෙක්නේ" චතුරගේ පියා

සිනාසෙමින් ඉදිරියට ඇවිද එන්නට විය. එයට චතුරගේ පිළිතුර වූයේ හැඟීම් විරහිත සිනහවකි.

චතුර සහ පියා කෙමෙන් කෙමෙන් නිවස වෙත ළඟා විය. ඈතදීම චතුර අමුතු යමක් දුටුවේ ය.

"කාගෙද මේක?" තම නිවසෙහි මිදුලෙහි තිබූ නවීන පන්නයේ මෝටර් රථය අතගාමින් චතුර ඇසී ය.

"ඇතුළට ගිහින් බලන්නකෝ" සරත් සිනාමුසු මුහුණින් චතුරට පිළිතුරු දුන්නේ ය. චතුර නිවස තුළට දිව ගියේ ය.

"මාමා..." තම නිවසේ සාලයෙහි අසුනකට බරව සිටි පුද්ගලයා දුටු චතුර ඉමහත් විස්මයට පත් ව හඬ නැගී ය. නමුත්, ඔහු නම් එය දුටු බවක් පෙනෙන්නට නොතිබුණි. ඔහුගේ දෑස් යොමුව තිබුණේ ජංගම දුරකථනයක් දෙසට ය.

"මල්ලි මේ බලන්නකෝ" තම පුතුගේ හඬ ඇසී මුළුතැන්ගෙයින් පිටතට පැමිණි අජන්තා කීවා ය. එවිට ය. මලිත්ගේ මාමා මලිත් දෙස හැරී බැලුවේ.

"ආ ඉලන්දාරියා කොහොම ද?" චතුරගේ මාමා චතුරගේ හිස අතගාමින් ඇසී ය.

"හොඳයි මාමේ" චතුර පිළිතුරු දුන්නේ ය.

"පුතා ශිෂ්‍යත්වෙ සමත්ලු නේ ද? මෙන්න මගෙන් ඒකට තෑග්ගක්" චතුරගේ මාමා චතුරට විශාල චොක්ලට් පෙත්තක් තෑගි දෙන ලදී. චතුර එයින් අතිමහත් විමතියට පත් විය.

"මෙච්චර ලොකු එකක්" චතුර පුදුමයෙන් ඇසුවේ ය.

"ඕවා තමයි කොළඹ තියෙන්නේ. හ්ම්... පුතා දැන් යන්න" කියූ මාමා නැවත තම අසුන කරා ගියේ ය.

චතුර චොක්ලට් පෙත්ත ද රැගෙන මුළුතැන් ගෙය කරා ගියේ ය. ඉන් පසු චොක්ලට් පෙත්ත හතරට

කඩා ඉන් එකක් මවට දුන්නේ ය.
"හප්පේ මේකෙ ලොකු. කෑලි කීයකට කැඩුව ද?"
චතුරගේ මව පුදුමයෙන්, නමුත් රහසින් ඇසුවා ය.
"හතරකට" චතුර පිළිතුරු දුන්නේ ය. නමුත් රහසින්.
"තාත්තටත් දියං" අජන්තා තම පුතුට කීවා ය.

චතුරගේ පියා ද චොක්ලට් පෙත්ත දැක ඉමහත් පුදුමයට පත් විය.
"මෙගෙ අප්පේ! අපිට නෑ නොවෑ මේ අරුමෝසම්"

චතුර ද ඉන් කැබැල්ලක් කා කැබැල්ලක් පරිස්සමට තැබුවා ය.
"කාට ද ඕක" චතුර චොක්ලට් පෙත්තක් රාක්කයෙන් තබනු දුටු අජන්තා ඇසී ය.
"නදීන්ට" චතුර පිළිතුරු දුන්නේ ය.
"ඒක හොඳයි. ඔය ළමයිට මෙහෙම ඒවා නැතුව ඇති. මේං මේ බොතලේට දාපං" අජන්තා පෙන්වූ බෝතලයට චතුර චොක්ලට් පෙත්ත දැමීය.

එදා රාත්‍රියේ පවුලේ සියලු දෙනා ඉස්තෝප්පුවට වී කතාබහක නිරත විය. නමුත් එවෙලෙහි නම් චතුරගේ මාමා අත දුරකතනය තිබුණේ නැත. ඒ වෙනුනට දුරකතනය තිබුණේ මාමාගේ දුව අතය.
"මම බැලුවෙ මල්ලි මේ පෝයට මහනුවර පැත්තෙ යන්න. මල්ලිලාටත් එන්න පුළුවන්නේ" චතුරගේ මාමා එවෙලෙහි ඇසී ය.
"පෝයට මල්ලි මාලිගාවෙ සෙනගනේ. අනික මේ වාරේ පෙරහැරත් එක්ක" සරත් කීවේ තමාට ද එක්වරක් පෙරහැර බැලීමට ගොස් සිදු වූ අකරතැබ්බයක් සිහි කරමිනි.
"ඒක ප්‍රශ්නයක් නැහැ. මම අඳුරන තැනක් තියෙනවා පෙරහැර යන පාරෙ ම. ඒක ගැන ප්‍රශ්නයක්

තියාගන්න එපා. අපි උදේ ම යමු. එතකොට හිතේ හැටියට වැඳගන්න පුළුවන්නේ" චතුරගේ මාමා පිළිතුරු දුන්නේ ය.
"තාත්තේ එතකොට ගමේ පෙරහැර" චතුර කීවේ ගමේ පෙරහැර බැලීමට ඇති ආශාවටත් වඩා නදීන් සමඟ එක්ව සිටීමට ඇති ආශාව නිසාම ය.
"ගමේ පෙරහැර වගේ ද පුතා නුවර පෙරහැර. හප්පා බලන්න වටිනවා" චතුරගේ මාමා පිළිතුරු දුන්නේ ය.
"ඒ වුණාට මාමේ මම කස ගහන්නත් ඉන්නවා" නදීන් කෙසේ හෝ උත්සාහ කරන්නේ ගමේ පෙරහැරට යාමටම ය.
"කස ගහන්න කෙනෙක් නැති වුණා කියලා පාඩුවක් නෑ. මම ලොකු හාමුදුරුවන්ට කියන්නම් කෝ." සරත් එවෙලහි නම් පිළිතුරු දුන්නේ මද තරහකිනි.
"අනේ එහෙනම් තාත්තේ නදීන්වත් එක්කගෙන යමු" චතුර සත්‍ය හෙළි කළේ ය.
"ආ... ඒක තමයි හොරේ. පුතේ, අපෙ කාර් එකේ හය දෙනෙකුට වඩා යන්න ඉඩ නෑනේ. හය යන්නෙත් හරි අමාරුවෙන්නේ. අපි යාළුවාවත් අරගෙන පස්සෙ දවසක යමු හොඳේ. අනික පුතේ නොගියෙත් තමන්ටමයි පාඩු. දළදා පෙරහැර එහෙම ලේසියකට බලන්නත් බෑ. අනික දියවඩන නිළමේ මගෙ හොඳ යාළුවා. අපිට පරණ මාලිගෙටත් යත හැකි" චතුරගේ මාමා කීවේ චතුර සනසන අටියෙනි.
"හොඳයි මාමේ" චතුර මඳ ශෝකයට පත්ව පිළිතුරු දුන්නේ ය.
"හරි හරි පුතා දුක්වෙන්න එපා. මම කිවුවනේ. අපි පස්සෙ දවසක එක්කගෙන යමු" චතුරගේ මාමා චතුර සනසන්නට උත්සාහ කළේ ය. චතුර හිස වැනුවා

පමණෙකි.

"එහෙම නම් අපි යමු. කට්ටියට නිදිමතත් ඇතිනේ." චතුරගේ මාමා චතුරගේ හිස අතගාමින් නැගී සිටියේ ය. සියල්ලෝ ම පිට විය.

තමා ටිකෙන් ටික නදීන්ගෙන් වෙන්වන බව චතුරට දැනිණි. මෙය එහි පෙර නිමිත්තක් වැනි ය. නමුත් ඉදිරියට සිදුවන දේ පිළිබඳව නදීන්ට කිසිඳු අවබෝධයක් නොවීය. අවසානයට,

චතුර පුටුව මත තනි විය.

# 3
# පෙර සූදානම

ඉර කෙමෙන් කෙමෙන් බැස යන්නට විය. නදීන් දකින්නට කැමති සොඳුරු ම දර්ශනය මෙයයි. "උදෑසන සිට ලොවට එළිය දුන් හිරු කඳු පන්ති අතර ගිලී යන ආකාරය සුවිසල් මහළු අඹ වෘක්ෂයක් මතට වී බලා සිටීම තරම් සොඳුරු දෙයක් තවත් කොයින් ද?" නදීන්ට සිතුනේ එලෙසයි. ඉර ගිලී ගිය පසු නදීන් සෙමින් සෙමින් ගසෙන් බැස ගියේ ය.

නදීන් නිවසට ළඟා වන විය රෑ බෝවී තිබුණි. මනරම් කඳු ගැටයක් මුදුනේ පිහිටා තිබුණු නදීන්ගේ උඩරට සම්ප්‍රදායේ නිවසට අවට ඇති සුන්දරත්වය මනා ව පෙනේ. මෙම සුන්දරත්වය විඳ ගනිමින් කඳු ගැටය නැග එන විට කාලය ගත වනු නොදැනේ. නදීන් නිවසට පැමිණෙන විට ම නදීන්ගේ සුරතල් බලු පැටියා නදීන්ගේ ඇඟෙහි එල්ලී වලිගය වනන්නට විය.

"ආ පුතා ආව ද?" බලු පැටියාගේ සුපුරුදු හඬ ඇසුණු මව ඇසුවා ය.

"ඔවු අම්මේ" නදීන් පිළිතුරු දුන්නේ ය.

"ඔය රෑට රෑ වෙනකම් ඔතන ඉන්න එපා. සතෙක් සර්පයෙක්වත් පෑගුණොත්" නදීන්ගේ මව කීවා ය.

"පුතා බය වෙන්න එපා. මමත් කාලයක් රෑට රෑ වෙනකම් ඔය ගහ උඩ හිටියා" නදීන්ගේ පියා හැමදාමත් මෙන් නදීන්ගේ උදවුවට ආවා ය.

"ඔයා තමයි ඔය ළමය ව නරක් කරන්නේ" යැයි නදීන්ගේ මව නදිනි නෝක්කාඩු කියන්නට වූවා ය.



මනරම් කඳු ගැටයක් මුදුනේ පිහිටා තිබුණු නදීන්ගේ උඩරට සම්ප්‍රදායේ නිවසට අවට ඇති සුන්දරත්වය මනා ව පෙනේ.

"ඇයි ඔයා පහළට වෙලා අඹ ඇහිලුවා මතක නැද්ද?" නදීන්ගේ පියා සමන් සිනාසෙමින් අසන්නට විය. නදීන්ගේ මව මුළුතැන්ගෙය දෙසට ඇවිද ගියේ ය.

එදින නදීන්ගේ නිවැසියන්ට වැඩ බහුල දිනයක් විය. පොහොය දින උදෑසන ධර්ම දේශනය භාරගෙන තිබුණෝ නදීන්ගේ නිවැසියන් විසිනි. ධර්ම දේශනයට ස්වාමීන් වහන්සේලා සිවුනමක් වඩින බව සමන්ට කල් තියා දැනුම් දී තිබුණි. එම නිසා උන් වහන්සේලා සඳහා අටපිරකර හා සෙසු පිරිකර සූදානම් කිරීමට විය.

"කාටද මේ සබන් ෂැම්පු" තම අත වූ ෂැම්පු බෝතලයක් පෙන්වමින් නදිනි ඇසුවා ය.

"පොඩි හාමුදුරුවොන්ට" සමන් පිළිතුරු දුන්නේ ය.

"අනේ අනේ. අපිත් ඔළුවෙ සබන් ගාලා නාන්නේ. කීය ද ෂැම්පු" නදිනි ඇසුවා ය.

"රුපියල් 25ක්" සමන් පිළිතුරු දුන්නේ ය.

"එච්චර. ලාබ එකක් බලලා ගන්න එපැයි" නදිනි කිවුවා ය.

"හාමුදුරුවෝ කියපු වර්ගෙ බලලා ගත්තේ" සමන් පිළිතුරු දුන්නේ ය.

"හපොයි හපොයි. ගමට වෙච්ච දෙයක්. මේ දත් බෙහෙත් එකකුත්" නදිනි කම්මුලෙහි අත ගසා ගත්තා ය.

"ඒක ඇබිත්තයාට" සමන් කීය.

"ඇබිත්තයාට මොකට ද හාමුදුරුවෝ දත් බෙහෙත් අරන් දෙන්නේ? අපිත් අඟුරුවලින් දත් මදින කොට" නදිනි ඇසුවා ය.

"ඔයා ගිහින් හාමුදුරුවොන්ගෙන් අහලන්නකෝ" සමන්

පැවසීය. ඉන් පසු පැවතුනේ මඳ නිහැඬියාවකි.
"මේ පාර පෙරහැරට පන්සලේ බල්බ් අදිනවලු කියන්නේ" සමන් යලි කතාව ආරම්භ කරන්නට විය.
"හැබෑට? කවුද අදිනව කියන්නේ?" නදිනි පුදුමයට පත්ව ඇසුවා ය.
"නුවරින් කෙනෙක් ගෙන්නලාලු" සමන් පිළිතුරු දුනි.
"කවුද කිවුවෙ?"නදිනි ඇසුවේ ඒ පිළිබඳ ව එතරම් විශ්වාසයක් නොවූ බැවිනි.
"ඇබිත්තයා කිවුවෙ" සමන් පිළිතුරු දුන්නේ ය. " ඇබිත්තයා වුණාත් අද කාලේ විශ්වාස කරන්න හොඳ නෑ. හැමෝම බලන්නෙ වල කපන්න" නදිනි කීවා ය.
"නෑ නෑ. මට මිනිහා විශ්වාසයි" සමන් පිළිතුරු දුන්නේ දැඩි විශ්වාසයෙනි.
"කොහෙන් ද ඉතින් හාමුදුරුවොන්ට ඔච්චර සල්ලි" නදිනි ඇසුවේ සැකයෙනි.
"කොළඹ ඉදන් ආපු මහත්තයෙක්ලු සල්ලි දෙන්නේ" සමන් පිළිතුරු දුන්නේ ය.
"කවුද දන්නෑ නේද ඒ?" නදිනිට අවශ්‍ය වූයේ මේ කවුදැයි දැන ගැනීමට ය.
"දන්නෙ නම් නෑ. හැබැයි ඊයෙ පෙරේදා ඇවිත් තියෙන්නේ" සමන් පිළිතුරු දුන්නේ ය. නමුත් ඒ චතුරගේ මාමා බව කිසිවෙකු නොදත්තේ ය.

නිදන කාමරයෙහි චතුරට ද මෙම සංවාදය කන වැකෙන්නට විය. නාගරීකරණය ගමට ද ටිකෙන් ටික ළඟා වන බව නදීන්ට සිතෙන්නට විය.

තමා එදිනෙදා කළ සෙල්ලම්, එදිනෙදා ඉගෙනගත් අලුත් පාඩම්, එදිනෙදා පාසලේ දී කළ ක්‍රියාකාරකම්, එදිනෙදා ගත කළ ජීවිතය මේ සමඟ වෙනස් වන බව ඔහුට දැනෙන්නට විය. ගමට ඇති

නොවිය යුතු තත්වයක් ඇති වන බව ඔහුට දැනෙන්නට විය. නමුත් තමා ද අඹ ගස ද කිසි දිනෙක වෙනස් නොවන බව දත් ඔහු සිනාසුණේ ය.

නමුත් තමාට ද යම් දිනෙක අඹ ගස හැර දා තම ජීවිතයේ යථාර්ථය සෙවීමට සිදු වනවා ඇත.

# 4
# බොක්ලටි පෙත්ත

තවත් දිනයක් උදා විය. නදීන් පළමු හිරු කිරණ වැටෙත්ම නදීන් අවදි විය. නදීන් දර ලිප අසලට ගොස් අඟුරු කැබැල්ලක් ගෙන එය පොල් කටුවකට දමා තලා ගත්තේ ය. අනතුරුව එයට ලුණු ස්වල්පයක් ද මිශ්‍ර කර ගත්තේ ය. ලුණු මඟින් මුඛ රෝග මඩනා බව පාසලේ ගුරුතුමා විසින් පැවසූ අයුරු නදීන්ට සිහිපත් වේ. නිවසට දත්බෙහෙත් ගෙන ආ යුතු බව නදිනි කියා සිටියත් සමන් තරයේ ම කියා සිටියේ දත් බෙහෙත් ගෙන නොආ යුතු බවයි.

"ඔවගෙන් මේ අඟුරු කෑල්ල තරම් හොඳට දත් පිරිසිදු වෙන්නේ නෑ" යන්න සමන් දැරූ මතය විය.

නදීන් නිවස අසල ජල පීල්ලට ගොස් මුහුණ සෝදන්නට විය. එහි ඇති සිසිල් නැවුම් ජලය නදීන්ට ප්‍රාණවත් බවක් ඇති කළේ ය. නදීන් ඇඳුම මාරු කරගෙන පැමිණියේ තම සුරතල් බලු පැටියා ව අවට වටයක් ගෙන යාමට ය. එය වැටහුණාක් මෙන් බලු පැටියා ද නදීන් අසල කැරකෙන්නට විය.

"ඉන්න ඉන්න. එක්කගෙන යනවා" නදීන් බලු පැටියා සමඟ නිවසින් පිටතට යන්නට විය.

"පුතේ පරිස්සමට ගිහින් එන්න" නදිනි සුපුරුදු ලෙස කීවා ය.

"හරි හරි අම්මේ. අපි පරිස්සමට ගිහින් එන්නම්" නදීන් පිළිතුරු දුන්නේ ය.

නදීන් සහ බලු පැටියා කන්දෙන් පහළට ඇවිදගෙන යන්නට විය. අවට ඇති සුන්දරත්වය නදීන්

මනා ව විඳ ගත්තේ ය. උදෑසනම තේ වතු කරා යන කම්කරුවන් නදීන්ට පෙනෙන්ට විය. තම පියා ද කාලයක් මෙලෙස ගමන් කළ බව නදීන්ට සිහි විය. දැන් තමාගේ පියා ගමේ මුදලාලි මහතාය. මව තවමත් කන්ද පහළ තේ කඩය කරගෙන යයි. ඇය ගැමියන් හඳුන්වන්නේ තේ කඩ මුදලාලි නෝනා ලෙසයි.
නදීන් තව තවත් පහළට යන්නට විය. නදීන් තම මවගේ තේ කඩය අසලට ළඟා විය.
ආ... පුංචි මහත්තයා ආව ද?" යැයි කියූ මැටිල්ඩා තේ කඩය තුළට ගියේ නදීන්ට තේ එකක් සාදාගෙන ඒමටයි. මැටිල්ඩා යනු තේ කඩයේ වැඩවලට මව විසින් වැඩට ගත් ගැහැණියයි. මව තේ විරාමය ළඟා කර කඩයට පැමිණෙන බැවින් එතෙක් එහි වැඩ කටයුතු බලා ගත්තේ මැටිල්ඩා විසිනි.
"ආ පුංචි මහත්තයා තේ එක" නදීන් මැටිල්ඩා විසින් ලබා දුන් තේ කෝප්පය පානය කරන්නට විය. උදෑසන ම මෙතැනට පැමිණි විට හකුරු කැබැල්ලක් සමඟ තේ කෝප්පයක් පානය කිරීම නදීන්ගේ සිරිතයි.

තේ කෝප්පය පානය කර අවසන්ව නදීන් තම ගමන නැවත අරඹන්නට විය. නදීන් ආපසු යන්නේ වෙනත් පාරකින් ය. එම පාර වැටී ඇත්තේ චතුරගේ නිවස අසලිනි. චතුර ද නදීන් එන තුරු මඟ බලාගෙන සිටී. දෙදෙනා එහි දී තමන් හවසට හමුවන්නේ අඹ ගස අසල ද නැති නම් නිවසේ දී ද යන්න තීරණය කරති. සුපුරුදු ලෙස ම චතුර නදීන් එන තුරු කඩුල්ල අසලට වී බලා සිටියේ ය.
"අපි කොහෙදී ද හම්බ වෙන්නේ?" නදීන් ඇසී ය.
"අඹ ගහ ළඟ දී හම්බ වෙමු. ඉන්න මම ළඟ ඔයාට තෑග්ගක් තියෙනවා " කියූ චතුර නිවස තුළට දිව

ගියේ ය. නදීන්ට මෙය ප්‍රෙහේලිකාවක් විය. සාමාන්‍යයෙන් නම් චතුර තමාට දෙයක් දෙන්නේ හවස දී බව නදීන් දැන සිටියේ ය.
"ආ මෙන්න. දැම්ම ම බලන්න එපා. ගෙදර ගිහින් බලන්න. දැම්ම ම දුන්නේ නැත්තම් දිය වෙනවා" කියූ චතුර සන්සුන් ලෙස නිවස තුළට ඇවිද ගියේ ය.

නදීන් මෙයින් යම්කිසි විමතියකට පත් විය. දිය වෙන්නට? අයිස් ක්‍රීම් විය නොහැක. නදීන් කෙමෙන් කෙමෙන් නිවසට ළඟා විය. අත් හොඳින් සෝදා ගත් නදීන් චතුර දුන් දෙය ආවරණය කර තිබූ පත්තර කොළය ඉවත් කළේ ය.
"චොකලට්?" නදීන් පුදුමයට පත් විය. නදිනි ද එය අසා සාලයට පැමිණියා ය.
"කොහෙන් ද පුතේ?" නදිනි පුදුමයට පත් විය.
"චතුර දුන්නේ" නදීන් පිළිතුරු දුන්නේ ය.
"අපෙ කඩේවත් නැහැ පුතේ ඔච්චර ලොකු ඒවා. අර පොඩි පෙත්තත් රුපියල් 30ක්" සැබැවින් ම නදීන් මෙයින් කුතුහලයකට පත් විය. චතුරලාට කොයින් ද මෙච්චර සල්ලි? සමහර විට, අර කොළඹ මහත්තයා ඉන්නේ නදීන්ගේ නිවසේ දැයි නදීන්ට සැකයක් ඇති විය. මේ පිළිබඳ ව චතුරගෙන් අසා දැන ගත යුතු යැයි නදීන් ට සිතෙන්නට විය.

එදින කාලය ගෙවී යන්නේ ඉතා සෙමිනැයි නදීන්ට සිතෙන්නට විය. දහවල් වන්නට මාසයක් පමණ ගියේ ය. නදීන් දවල්ට කෑවේ ද ඒ පිළිබඳ සිතමින් ය.
"මොකද පුතේ?" නදීන් ගේ වෙනස දුටු නදිනි ඇසුවා ය.
"මොකුත් නැහැ අම්මේ" නදීන් පිළිතුරු බැන්දේ ය.
"හා... එහෙනම් කමක් නෑ. දැන් අන අන ඉන්නෙ

නැතුව කන්නකෝ" නදිනිට ද උද්‍යෑසන සිදු වූ සිදුවීම අමතක ව ගොස් තිබුණි. එමනිසා නදිනි නදීන්ගේ හැසිරීම එතරම් මායිම් කළේ නැත.

කෙසේ හෝ සවස් කාලය උදා විය. නදීන් අඹ ගස වෙත ගියේ ය. නමුත් ඒ වන විටත් චතුර එහි සිටියේ නැත. නදීන්ට චතුර පැමිණෙන තුරු ඉවසිල්ලක් නැත. විනාඩියක් ගියේ ය, දෙකක් ගියේ ය, චතුර තව ම නැත. චතුර පැමිණීමට තවත් මිනිත්තු පහක් පමණ ගියේ ය. නදීන්ට එය කල්පයක් මෙන් දැනිණි. චතුර පැමිණෙන බව දුටු විට නදීන්ට යම් සහනයක් දැනෙන්නට විය.

"යමු යමු. නගින්න" සුපුරුදු හඬ ඇසෙන්නට විය. නදීන් හා චතුර ගසට නැග ගත්හ.

"මොකෝ පරක්කු?" නදීන් ඇසුවේ චතුරගේ ප්‍රමාදයට හේතුව සොයාගන්නා අටියෙනි

"ආ... අපෙ මාමලා ආවනේ. තේ බීලා එන්න වුණා. නැත්තම් හරි නෑනේ. ඒත් එච්චර පරක්කුවක් නෑනේ" චතුර කීවේ ය.

"හා... එහෙම ද? ඒක නෙවෙයි. ඔයාලගෙ මාමලා කොහෙද? නුවරද?" නදීන් ඇසුවේ පන්සලට ආධාර කරන්නේ චතුරගේ මාමා දැයි දැන ගැනීමට ය.

"නෑ නෑ. මාමලා කොළඹ" චතුර පිළිතුරු දුන්නේ ය.

"ආ... එතකොට ඔයාගෙ මාමා වෙන්න ඇති අර පන්සලට ආධාර කරලා තියෙන්නේ" නදීන් ඇසුවේ සැකය තහවුරු කර ගැනීමට ය.

"ආධාර? මොනවට ද?" චතුර පුදුමයෙන් ඇසුවේ ය.

"පන්සලට බල්බ් අදින්න" නදීන් පැවසුවේ ය.

"නෑ... මම නම් එහෙම දෙයක් දන්නේ නෑ. හරියට ම නම් කොහොම ද දන්නේ නෑ" චතුර කිවුවේ ය. නමුත්

ඒ තම මාමා බව ඔහු ද නොදත්තේ ය.චොක්ලට් පෙත්තකින් ඇරඹින් මෙය කොතැනකින් අවසන් වේ දැයි නදීන්ට සිතාගත නොහැකි විය. එය මෙම අඹ ගසටත් බලපාවි ද? කවුද මේ අමුත්තා? නදීන්ට කිසිවක් සිතාගත නොහැකි විය. නදීන් ගසෙන් බැස යන්නට විය.

"නදීන් කොහෙ ද යන්නේ?" චතුර ඇසී ය.

"මගෙ ඔළුව පොඩ්ඩක් රිදෙනවා වගේ. මම යනවා" යැයි කියූ නදීන් ගසෙන් බැස ගියේ ය. චතුර නදීන්ගේ මග දෙස හැරී බැලී ය.

# 5
# අලුත් තෑග්ග

නදීන් ගසෙන් බැස ගිය පසු චතුර එහි තනි විය. නදීන්ට එක්වර ම ඇති වූ වෙනස චතුරට වටහාගත නොහැකි විය. සමහර විට චොක්ලට් පෙත්ත අගුණ වී ද? චතුර ගසෙන් බැස ගත්තේ ය. ඉර බැස යාමට ආසන්නව තිබුණි. දැන් නදීන්ගේ නිවසට යා නොහැකි ය. චතුර ආපසු හැරුණේ ය. චතුර හෙමින් හෙමින් නිවස දෙසට ඇදී ගියේ ය. චතුර නිවසට ළඟා වන විට ඔහුට යම් වෙනසක් ඇති බව ඔහුට වැටහුණි. ඔව්, චතුරගේ මාමාගේ මෝටර් රථය ඔහුට දක්නට නොවී ය. ඔවුන්
තමාටත් නොකියා යන්නට ඇතැයි ඔහුට සිතෙන්නට විය. නමුත් ඔවුන් මුළු නිවාඩුව ම මෙහි නතර වන බව කියා තිබුණි. එසේ නම්?

"තාත්තේ මාමලා කෝ?" චතුර තම පියාගෙන් ඇසුවේ ය.

"ඔය නුවරට යනවා කියලා ගියේ" සරත් පිළිතුරු දුන්නේ ය.

චතුරට යම් පුදුමයක් ඇති විය. තම මාමා අපට පෙර ගොස් නිදහසේ මාලිගාව වැඳගෙන
එන්නට ගියාවත් ද? නමුත් තම මාමා එසේ නොකරන බව චතුර තදින් ම විශ්වාස කළේ ය. කොළඹ මිනිසුන් විශ්වාස කළ නොහැකි බවට පන්සලේ හාමුදුරුවන් කළ ප්‍රකාශය ඔහුට සිහි විය.

"කොහෙද දන්නෑ නේද තාත්තේ ගියේ?" චතුර සරත්ගෙන් ඇසුවේ තම සැකය දුරු කර ගැනීමට ය.

“බඩු වගයක් ගන්න තියෙනවා කිවුවේ. පන්සලේ බල්බ් අදින්න දෙන්න. අපේ ගෙදරටත් බල්බ් ඇදලා දෙනවා කිවුවේ” සරත් කීවේ ය.

චතුරට නදීම් කී දෙය සිහිපත් විය. එසේ නම් ඒ දානපතියා තම මාමා ද? නමුත් චතුරට නම් එහි වරදක් නොපෙනුණේ ය. පන්සලට ලයිට් ලැබීම කොතරම් හොඳ දෙයක් ද? චතුරට නුවර විදුලියෙන් ආලෝකමත් කර තිබූ අයුරු සිහිවිය. ගමේ පන්සල එවිට රාත්‍රියට ආලෝකයෙන් දිදුලනු ඇත. චතුරට ඇති වූ සිතුවිලි එසේ ය. නමුත් චතුර එහි අනිසි පැත්ත දුටුවේ නැත.

“මොකද තාත්තේ මාමා එච්චර වියදම් කරන්නේ?” චතුර ඇසුවේ ය.

“මාමගෙ නෝනයි දුවෙකුයි මැරුණානෙ. ඒකෙ දුකටනේ ඔය” සරත් පවසන විටයි චතුරය එය සිහිපත් වූයේ. පසුගිය වසරේ සිදු වූ රිය අනතුරකින් මාමාගේ බිරිඳ සහ තුන් හැවිරිදි දියණිය මිය ගියහ. පාරේ නවතා තිබූ මාමාගේ කාරය වේගයෙන් පැමිණි තවත් මෝටර් රථයක් මඟින් හැප්පීමෙන් මෙම අනතුර සිදු විය. චතුර සහ චතුරගේ පවුලේ අය මාමලාගේ නිවසට ළඟා වන විට අවසන් කටයුතු ද අවසන් වී තිබුණි. ඒ මාමා එවූ ටෙලිග්‍රෑමය තැපැල් කාර්යාලයේ දී ප්‍රමාද වීමෙනි.

“ඕකුන් කවද්ද මල්ලි දුප්පත් අපේ ගම් දිහා බැලුවේ” මාමලාගේ නිවසට පැමිණ සිදුවීම දැනගත් සරත් කීවේ ය. එම සිදුවීමෙන් පසු චතුරගේ මාමා විසින් රජයට බලපෑම් කර ගමෙහි තැපැල් කාර්යාලයක් ඉදි කරවන ලදී. ධනවත් ව්‍යාපාරිකයෙකු වූ චතුරගේ මාමාගේ බලපෑමෙන් මිදීමට රජයට නොහැකි වූ බැවින් ඔවුන්ට ගමෙහි තැපැල් කාර්යාලයක් ඉදි කිරීමට සිදු විය. ඒ සඳහා මාමාට පරම්පරාවෙන් උරුම වූ ඉඩමක්

පරිත්‍යාග කරන ලදී. එමෙන් ම ගමෙහි තිබූ සියලු තේ වතු මාමා විසින් මිලට ගන්නා ලදී. එබැවින් චතුරගේ මාමා දිනෙන් දින දියුණුවට පත් විය. යලි විවාහයක් කර ගැනීමට අකැමති වූ චතුරගේ මාමා තනිකඩයෙකු ලෙස ජීවත් විය. චතුරගේ මාමා ගමට පැමිණ ඇත්තේ තේ වතු ටික ද දැක බලා ගැනීමට ද විය යුතු යැයි චතුරට සිතුනි.

රාත්‍රී කෑම වේල කිට්ටු කර මාමාගේ මෝටර් රථය නිවසට පැමිණෙනු චතුර දුටුවේ ය. මාමා විසින් බඩු පෙට්ටි ගොඩක් ගෙන පිටතින් තබන ලදී.

"චතුර පුතා පුළුවන් ද මට පොඩි උදව්වක් දෙන්න" චතුරගේ මාමා චතුරට කතා කරන ලදී. චතුර ද ගොස් මාමාට හැකි උදවු දෙන ලදී. සරත් ද චතුරට එසවීමට අපහසු පෙට්ටි ඔසවා දුන්නේ ය.

"ඔන්න පුතාට කියන්න සුබ ආරංචියක් තියෙනවා" චතුරගේ මාමා කීවේ කෑම මේසයට වාඩි වීමෙන් අනතුරුව ය.

"මොකද්ද ඒ?" චතුර පුදුමයට පත්ව ඇසුවේ ය.

"පුතාට කොළඹ ඉස්කෝලෙකට යන්න ලකුණු තියෙනවා" චතුරගේ මාමා පැවසීය. චතුර එයින් පුදුමයට පත් විය.

"අනේ කොච්චර හොඳ ද?" සතුටෙන් උද්දාමයට පත් වූ අජන්තා පැවසුවා ය.

"මල්ලිට හොඳට ම විශ්වාස ද?" එම සිද්ධිය විශ්වාස කළ නොහැකි වූ සරත් ඇසී ය.

"ඔව් ඔව් මම එනකොට නුවරින් බලාගෙන ආවේ කඩයිම් ලකුණු. කොළඹ රෝයල් එකටත් යත හැකි. අපෙ ගෙවල් ළඟමනේ" චතුරගේ මාමා පැවසුවේ දැඩි විශ්වාසයෙනි.

“එහෙනම් ඉතින් කොළඹ යන්න වෙයි” සරත් ඇසුවේ චතුර දෙස බලමිනි
“අනේ මන්දා ඉතින්” චතුර කීය.
“චතුර පුතා හිතලා බලලා තීරණයක් ගනියි. අපි එයාට කල් දෙමු” චතුරගේ මාමා පැවසුවේ ය. එය චතුරට ඉමහත් සහනයක් විය.

එදින තවත අමුතු ම සිදුවීමක් සිදු විය. පවුලේ සාමාජිකයන් සුපුරුදු පරිදි ඉස්තෝප්පුවට වී කතාබහ කරමින් සිටින අතර,
“චතුර පුතා කොළඹ ඉස්කෝලෙකට තේරුණ එකට මගෙන් පොඩි තෑග්ගක් තියෙනවා” චතුරගේ මාමා කීය.
“මම තාම තේරුණේ නැහැනේ” චතුර පිළිතුරු දුන්නේ ය.
“ආය තෝරගන්නේ නැතුව කොහොම ද? ලකුණුත් අරගෙන” චතුරගේ මාමා පැවසී ය.
“මොකද්ද ඉතින් තෑග්ග?” චතුර ඇසුවේ මේ අලුත් තෑග්ග කුමක් දැයි දැනගන්නී අටියෙනි.
“ආ මෙන්න” චතුරගේ මාමා චතුරට දුන්නේ නවීන මාදිලියේ ජංගම දුරකතනයකි.
“මොනවා?” පුදුමයට පත් වූ චතුර ඇසී ය.
“මල්ලි ඕවා ළමයිට දැම්මම හොඳ නෑ නේ ද?” සරත් ඇසුවේ යම් කිසි අවිශ්වාසයකිනි.
“නෑ නෑ. එහෙම ප්‍රශ්නයක් නෑ. දැන් ළමයි ලෝකෙත් එක්ක අලුත් වෙන්න ඕනේ. නැත්තම් ඉතින් ළිඳේ ඉන්න ගෙම්බා වගේ තමයි” චතුරගේ මාමා පිළිතුරු දුන්නේ ය.
“ඒ වුණාට මාමේ මම මේක පාවිච්චි කරන්නවත් දන්නේ නෑනේ” චතුර කීය.
“පොඩ්ඩක් ඉන්න මම කියලා දෙන්නම්” චතුරගේ මාමා

චතුරට දුරකතනය භාවිතා කරන ආකාරය පියවරෙන් පියවර කියා දෙන්නට විය. චතුර ඉක්මනින්ම එය භාවිතා කරන ආකාරය වටහා ගත්තේ ය.
"චා... ඔය අල්ල ගත්තෙ කොල්ලා. හරි දක්ෂයානේ. නංගි තව ඒවා දන්නවා ඇති. එයාගෙන් අහගන්න. හ්ම්... යන්න" චතුරගේ මාමාට තමාව පිට කර ගැනීමට අවශ්‍ය වූ බව වැටහුණු චතුර පිටව
ගියේ ය. චතුරගේ ඥාති සහෝදරිය අන්තර්ජාලය භාවිතා කරන ආකාරය හා දුරකතනයෙන් ක්‍රීඩා කරන ආකාරය කියා දුන්නේ ය.
තමා නදීන්ගෙන් හා ස්වභාව ධර්මයෙන් වෙන්වන බව නදීන්ට වැටහුණේ නැත.

# 6
# රැස්වන කුණාටුව

තවත් දවසක් උදා විය. නදීන්ගේ උදෑසන අවදි වූ මොහොතේ සිට නින්ද දක්වා සුපුරුදු ලෙස පැවතීමට ඉඩ තිබුණි, එක් දෙයක් සිදු නොවූයේ නම්.

එදින උදෑසන නදීන් සුපුරුදු ලෙස තම බලු පැටියා සමඟ ඇවිදින්නට යන්නට විය. කන්දෙන් පහළට ගොස් තේ එක ද බී කන්ද නැග එන්නට විය. නදීන් සුපුරුදු ලෙස පා නැගුවේ චතුරගේ නිවස දෙසටයි. නමුත් එදින වෙනදා මෙන් චතුර කඩුල්ල අසල නොසිටියේ ය. නදීන්ට ඒ වනුවට මෝටර් රථයක නැගී එන පුද්ගලයෙකු පෙනෙන්නට විය.

“ආ පුතා කොහොම ද?” එම පුද්ගලයා ඇසීය. ඒ වෙන කවුරුවත් නොව චතුරගේ මාමායි

“හොඳයි මාමේ” නදීන් පිළිතුරු දුන්නේ ය.

“පුතා මොකද?” චතුරගේ මාමා ඇසීය.

“චතුර ඉන්නවා ද කියලා බැලුවේ මාමේ” නදීන් කීය.

“ආ… මේ නදීන් පුතා වෙන්න ඕනේ?” චතුරගේ මාමා ඇසීය.

“ඔව් මාමේ” නදීන් පිළිතුරු දුනි.

“චතුර පුතා කියන්න කිවුවා හවසට ගෙදර එන්න කියලා. හරි ද?” කියූ චතුරගේ මාමා යන්නට ගියේ ය.

නදීන්ට එයින් යම් නිසි අමුත්තක් දැනෙන්නට විය. චතුර කිසි දිනෙක මෙවැනි දෙයක් සිදු කර නැත. ලෙඩක් දුකක් හැදුන ද චතුරගේ මව හෝ පියා අත පණිවිඩයක් එවයි. නමුත් එලෙස ද නොවේ. එසේ නම්?

නදීන් බලු පැටියා ද රැගෙන නිවස කරා එන්නට

විය. මඟ දිගට ඇති විසිතුරු බැලීමට ඔහුට දැන් සිත් නැත. ඔහු විශාල ප්‍රශ්නයක් ඇති වී
තිබේ. එයට පිළිතුරු අද සවස දී ලැබෙනු ඇත. නදීන් එතෙක් ඉවසා සිටින්නට තීරණය කළේ ය.

සවස් යාමය උදා විය. නදීන් චතුරගේ නිවස කරා ඇවිද යන්නට විය. වෙනදා මෙන් චතුර නදීන් එනතුරු මඟ බලාගෙන සිටියේ නැත. නදීන්ට විශාල වෙනසක් දැනෙන්නට විය. එක් දිනකට මෙතරම් වෙනසක් සිදු විය හැකි ද? නදීන් චතුරගේ නිවසට ඇතුළු විය.

"ආ මේ චතුර පුතානේ. එන්න ඇතුළට. වාඩිවෙන්න" නිවස තුළට පැමිණෙන නදීන් දුටු අජන්තා පැවසීය. " පොඩ්ඩක් ඉන්න මම චතුරට කතා කරන්නම්" කියූ අජන්තා පිටව ගියා ය.

චතුර කෙමෙන් කෙමෙන් වෙනස් වන බව නදීන්ට වැටහෙන්නට විය. වෙනදා නිවස තුළ සිටිය ද නදීන් පැමිණි වහා ම පිටතට පැමිණෙන චතුර අද ප්‍රමාද වෙයි. මෙයට හේතුව නදීන්ට වටහා ගත නොහැකි විය.

"ආ නදීන්... පොඩ්ඩක් පරක්කු වුණා. මම යන්න ඉන්න අලුත් ඉස්කෝලෙ ගැන වීඩියෝ එකක් බල බල හිටියේ" කියූ චතුර අසුන් ගත්තේ ය.

"මොනවා? වීඩියෝ? ඒ කියන්නනේ?" නදීන් කිසි දිනෙක වීඩියෝ පිළිබඳ අසා නොතිබුණේ ය.

"ආ ඔව්. ඒ කියන්නේ නිකම් චිත්‍රපටි වගේ" චතුර පිළිතුරු දුන්නේ ය.


"ඒ කියන්නේ ඔයා වෙන ඉස්කෝලෙකට යනව ද?" නදීන් පුදුමයෙන් ඇසී ය.

"ඔව් මම කොළඹ ඉස්කෝලෙකට යන්න බැලුවේ" චතුර කිසිඳු පැකිලීමකින් තොරව පිළිතුරු දුන්නේ ය.

"ඒත් චතුර, කොහොම ද ඔයා මේ හැමදේම දාලා යන්නේ?" නදීන් අතිශය පුදුමයට පත් විය.
"මොනවද?" චතුර ඇසීය.
"මේ ගෙදර, ඔයාගෙ පවුල, ඉස්කෝලෙ යාළුවෝ, අඹ ගහ, මේ හැමදේම" නදීන් කීය.
"මට ඒ හැමදේට ම වඩා මාව මට වටිනවා. කරුණාකරලා නදීන්, මට යන්න දෙන්න" යැයි කියූ චතුර පිටව යාමට නැගිට්ටේ ය. යාමට පෙර,
"මට බාධා කරන හැමෝම මට පේන්නේ හතුරෝ වගේ. ඔයා වුණත්" යැයි කියූ චතුර පිට ව ගියේ ය.

නදීන් පුටුවෙන් නැගිට ගත්තේ ය. නදීන්ට චතුරට සිදු ව ඇති දෙය වටහා ගත නොහැකි විය. මෙතරම් වෙනසක් ඔහු චතුරගෙන් බලාපොරොත්තු වූයේ නැත.නදීන්ට චතුරගේ ක්‍රියාව දැන් හිසරදයක් වී තිබේ. නමුත් නදීන්ට ඔහු අත්හැරිය නොහැක. ඒ නදීන්ගේ හොඳ ම මිතුරායි. ඔහු තම ජීවිතය නැවත ප්‍රතිනිර්මාණය කළේ ය. තමා ඉගෙනීමට උනන්දු කළේ ඔහු ය. තමාගේ සෑම සවස් යාමයකට ම අරුත් බර මිහිරක් එක් කළේ ඔහු ය. නදීන්ට ඔහු අත්හැරිය නොහැකි බවක් දැනුණි. නමුත්?

නදීන් තම නිවසට ඇවිද යන්නට විය. ඔහුට විශාල තනිකමක් දැනෙන්නට විය. චතුර තමාට බැණ වැදුන ආකාරය ඔහුට යලි යලිත් මැවී පෙනෙන්නට විය. නදීන් තම නිවසට ළඟා විය. නදීන් නිවසට පිවිසෙත් ම නදීන්ගේ සුරතල් බලු පැටියා සුපුරුදු ලෙස ඔහුගේ ඇඟෙහි දැවටෙන්නට විය. නමුත් ඔහුට බලු පැටියා සුරතල් කිරීමට තරම් මානසික තත්වයක් නොවුණි.
"ආ මොකද අද අයිතිකාරයා කලින් ම?" කියමින් නදිනි සාලයට ඇවිදගෙන එන්නට විය. ඇයට නදීන්ගේ



නදීන් නිවසට පිවිසෙත් ම නදීන්ගේ සුරතල් බලු පැටියා සුපුරුදු ලෙස ඔහුගේ ඇඟෙහි දැවටෙන්නට විය. නමුත් ඔහුට බලු පැටියා සුරතල් කිරීමට තරම් මානසික තත්වයක් නොවුණි.

මුහුණෙහි අවුල් සහගත බව පෙනෙන්නට විය. "මොකද පුතේ මූණ අවුල් වෙලා" නදිනි ඇසුවා ය. නදීන් සම්පූර්ණ සිද්ධිය ඇයට පැවසුවා ය.
"පුතා ඕවා ගණන් ගන්න එපා පුතේ. ආය යාළුවෙයි" කියා නදීන් සැනසූ ඇය ආහාර පිසීම සඳහා මුළුතැන්ගෙට ගියා ය. නමුත් නදීන්ට එය සැනසීමට තරම් කාරණයක් නොවීය. නදීන්ට මේ පිළිබඳව තව සිතිය යුතු විය. ඔහු තම නිදන කාමරයට ගොස් ඇඳෙහි වැතිරුණා ය. නදීන් කෙමෙන් කෙමෙන් නිදි දෙව්දුව අතරට පිවිසෙන්නට වූවේ ය.
"පුතේ...පුතේ..." යන හඬින් නදීන් අවදි විය. ඒ නදීන්ගේ පියාගේ හඬයි. නදීන් ඇඳන් බැස සාලය දෙසට ඇවිද යන්නට විය.
"වාඩි වෙන්නකො පුතේ මෙතනින්" නදීන් පියා අසලින් අසුන් ගත්තතේ ය.
"දැන් කියන්න බලන්න. මොකද වුණේ?" නදීන්ගෙ පියා ඇසී ය. නදීන් සියල්ල ම පියාට පැවසීය.
"පුතේ, අපේ ගම දැන් නවීකරණය වෙලා. පන්සලේ බල්බ් අදිනවා. හාමුදුරුවෝ අද මට කිවුවා හෙට දවල් දානෙ මොකද්දො කේටරින් එකකින් අරන් දෙන්න කියලා. හාමුදුරුවොන්ට එළවළු බත්. පොඩි හාමුදුරුවොන්ට මොනා ද රයිස්. බයිසිකලේ ආව පියුන් මහත්තයි දැන් එන්නේ බයික් එකේ. ඒක තමයි පුතේ නවීකරණය. පුතාගෙ යාළුවාටත් වුණේ ඒක. නවීකරණය හොඳ විදියටත් බලපානවා, නරක විදියටත් බලපානවා. පුතාගෙ යාළුවාටත් කාලයක් යද්දි ඒක තේරෙයි" සමන්ගේ පැහැදිලි කිරීමට නදීන්ගේ සිත සන්සුන් වුණි.
"තාත්තෙ මට පුළුවන් ද නුවර ඉස්කෝලෙ යන්න?"

නදීන්ගේ පියාගෙන් ඇසී ය.
"පුළුවන්, ඒත් ඇයි?" සමන් ඇසී ය.
"මමත් ආසයි තාත්තේ නවීකරණයත් එක්ක හොඳ පැත්තට යන්න" නදීන් පිළිතුරු දුන්නේ ය.
"ඒක බොහොම හොඳයි. පුතා ඒ විදිහට හිතන එකත් ලොකු දෙයක්. මම අයදුම් කරන්නම්" නදීන්ගේ පියා පැවසීය.
දිනෙන් දින ගමට සමීප වන නවීකරණයත් සමඟ නදීන් උඩුගං බලා පිහිනීමට උත්සාහ දරයි. එය ම උත්සාහය සාර්ථය වේවි ද?

# 7
# දළදා පෙරහැර

පොහොය දිනය උදා විය. චතුරගේ පවුලේ අය මහනුවර දළදා පෙරහැර බැලීමට යන දිනය අදයි. චතුරගේ මව උදෑසනම අවදි වී ආහාර පිසුවා ය. අනතුරුව බත් මුල් බැඳීම සඳහා සරත් ව අවදි කළේ ය. සරත් සහ අජන්තා බත් මුල් බඳින අතර චතුරගේ මාමා ද අවදි විය.

"ආ නංගි කොහොම ද? කට්ටිය ම බරට ම වැඩ වගේ." චතුරගේ මාමා ඇසීය.

"ඔව් මල්ලි. උදේ ම යනකොට මඟදි බඩගිනි වෙන නිසා බත් බැඳගන්නවා" අජන්තා පිළිතුරු දුන්නේ ය.

"හා හොඳයි. දවල්ට එහෙම බැඳගන්න එපා හරි ද? දවල්ට කෑම මං ගානේ" චතුරගේ මාමා කීය.

"අයියෝ මල්ලි කලින් කියන්න එපෑය. අපි දවල්ටත් එක්කමයි ඉවුවේ." සරත් කීවේ ය.

"හා... ඒකත් එහෙම ද? කමක් නෑ අද සැණකෙලියත් තියෙනවානේ. අපි ඒකටත් ඉඳලා එමු. එතකොට මට රෑට කෑමත් අරන් දෙන හැකිනේ" චතුරගේ මාමා පැවසුවේ ය.

"අනේ මල්ලි එච්චර වෙලා නම් ඉන්න බැරි වෙයි නේද?" අජන්තා වෙනස් ස්වරයකින් පැවසුවා ය.

"අයියෝ නංගී... මේක කාලෙකට සැරයක් එන අවස්ථාවක් නේ. පොඩි උන්ට සෙල්ලම් කරන්න පොඩ්ඩක් ඉඳලා එමු. ආය කවදා යන්න ද?" චතුරගේ මාමා පවසන විට අජන්තාගේ සිත වෙනස් විය.

"එහෙනම් මල්ලි අපි එහෙම කරමු. අම්මවත් ලෑස්ති කරගන්න එපැයි. අපි පොඩි අයව ඇහැරවමු" අජන්තා කීවා ය.

චතුරගේ පියා ගොස් චතුර ද චතුරගේ මාමාගේ දුව ද ඇහැරවා ගත්තේ ය. වෙනදා උදෑසන ම අවදි වන චතුර රාත්‍රියේ දුරකතනයෙන් ක්‍රීඩා කිරීමට පුරුදු වීම නිසා චතුර මඳක් එළිවන තුරු නිදා ගත්තේ ය. චතුරගේ මෙම අලුත් හැසිරීම ඔහුගේ දෙමව්පියන්ට ද ගැටලුවක් විය. නමුත් චතුරගේ මාමාගේ අදහස වූයේ,

"මේ කාලෙ ළමයි ඔහොම තමයි. රෑට ඇහැරලා පොඩ්ඩක් එළි වෙනකම් නිදා ගන්නවා. අපෙ දුවත් එහෙමනේ. කෝ මං මොකුත් කියනවා ද?"යන්නයි.

කෙසේ නමුත් පිරිස ගමනට සූදානම් වී හමාර විය. ඉන්පසු සියල්ලෝ ම කාරයට නැගුණාහ. චතුරගේ ආච්චි ද සරත්ගේ හා චතුරගේ මාමාගේ උදවු ඇතිව කාරයට නංගවා ගත්තේ ය. බත් මුල් හා ආහාර බඳුන් කාරයේ පිටුපසට පටවන ලදී

"එහෙනම් ඔක්කොම හරිනේ? එහෙනම් බුදු සරණයි දෙවි පිහිටයි කියලා පිටත් වෙමු." කියූ චතුරගේ මාමා කාරය පණ ගන්වා පිටත් විය.

චතුර මීට පෙර මහනුවර ගොස් ඇත්තේ දෙවතාවකි. එක්වරක් ගියේ ශිෂ්‍යත්වයට බාරයක් වීමට ය. අනෙක් වර ගියේ සරත්ට අවශ්‍ය කුඹුරු ආම්පන්න වගයක් රැගෙන ඒමට උදවු වන්නට ය. ඒ දෙසැරය ම චතුර ගියේ බසයේ ය. කුඹුරු ආම්පන්න රැගෙන එන විට දී පමණක් ලොරියක් ගෙන්වා ගන්නා ලදී. වෙනත් වතාවල දී වටපිට සිරි නරඹමින් ගිය චතුර දැන් තම ඥාති සහෝදරිය සමඟ දුරකතනයෙන් ක්‍රීඩාවක

නියැලෙමින් සිටියි.

වාහනය අතරමඟ උදෑසන ආහාරය සඳහා නවත්වන ලදී.

"හා හරි දැන් බහින්න..." චතුරගේ මාමා පැවසීය.

චතුර ද තම දුරකතනය සාක්කුවට දා ගත්තේ ය. ඉන්පසු අනෙක් අයත් සමඟ ම ඔහු ද කාරයෙන් බැස ගත්තේ ය. සරත් කාරය පිටුපස තිබූ ආහාර එළියට ගත්තේ ය. බත් මුල් බැඳ තිබුණේ චතුරගේ මාමා ගෙනා පොලිතීන් කොළවලය. එබැවින් ආහාර ගැනීම සඳහා පිඟන් අවශ්‍ය විය. සියලු දෙනා ම පිඟන්වල බත් එළාගෙන කන්නට විය. චතුරගේ ඥාති සොයුරියට ගමේ ආහාරවලට එතරම් ප්‍රිය නොවූව ද ආහාරයට ගත්තේ දහවලට හෝටලයකින් කන බව පියා කියා තිබුණු නිසා ය. නමුත් ඈය උදෑසන සිදු වූ කතාබහ පිළිබඳ නොදත්තා ය.

පිරිස ආහාර ගෙන අවසන් විය. මාමා පැවසුවේ පොලිතීන් කොළෙ ඉවතට විසි කරන ලෙසයි. නමුත් සරත් එයට විරුද්ධ විය.

"බැරි වෙලාවත් මොකෙක් හරි සතෙක් ඕක කෑවොත් මොකද කරන්නේ? ඒ හින්දා අපි මේවා ගෙනියමු" යන්නයි. චතුරගේ මාමාට එම අදහස පිළිගන්නට විය. එම නිසා පොලිතීන් කොළ වාහනයට දමාගෙන ඔවුන් පිටත් විය. සුළු මොහොතකට පසු ඔවුන් දළදා මාලිගාවට සේන්දු විය.

දළදා මාලිගාව තුළ දුරකතන භාවිතා කළ නොහැකි බැවින් චතුර එය තම සාක්කුවට දා ගත්තේ ය. චතුරගේ බාරය ඔප්පු කිරීම සඳහා අජන්තා අත කිරි ආහාර බඳුනක් ද විය. දළදා මාලිගාව තුළ යම් කිසි තද බදයක් තිබුණා ද චතුර ඇතුළු සියලු දෙනා

සිත් සේ දළදා මාලිගාව වැඳ පුදා ගත්හ. නමුත් ඒ අතර ඔවුන් නොසිතූ දෙයක් සිදු විය. චතුරගේ ජංගම දුරකතනය යම් අයෙකු විසින් සොරකම් කර තිබුණි. නමුත් මාලිගාවෙහි තිබූ තදබදය නිසා කිසිවෙකුට එය නොදැනිණි.

චතුර ඇතුළු පිරිස මාලිගාවෙන් පිටතට පැමිණි අතර චතුරගේ මාමා මාලිගාවේ දිය වඩන නිළමේ සොයා ගියේ ය. එවෙලෙහි චතුර තම දුරකතනය ගැනීමට ගිය විට එය නොමැති බව දිටීය.

"තාත්තෙ මගෙ ෆෝන් එක නෑනේ" චතුර සරත්ට පැවසීය.

"ආ... එහෙම ද? පොඩ්ඩක් ඉන්න අපි මාමා ආවට පස්සෙ බලමු" සරත් පැවසීය. සරත් ඒ පිළිබඳව වැඩි දුර සෙවීමට නොගියේ ඒ පිළිබඳව හිත යටින් සතුටු වූ බැවිනි. නමුත් ඔහු එය පිටතට නොපෙන්වා සිටියේ ය. දරුවන් අතට දුරකතන නොලැබිය යුතු බව ඔහුගේ විශ්වාසය විය.

"බලන්නකො මල්ලි අද පෙරහැරනේ. නිළමේ බරට ම වැඩ. අපි පස්සෙ දවසක බලමු" කියමින් චතුරගේ මාමා පැමිණියේ ය.

"අනේ මාමේ බලන්නකෝ. මගෙ ෆෝන් එක නැතිවෙලානේ" චතුර තම මාමාට සිදුවීම පැවසීය

"අප්පට සිරි එහෙම ද? කොහෙදි ද නැතිවුණේ?" චතුරගේ මාමා පුදුමයට පත් ව ඇසී ය.

"මම හිතන්නේ මාලිගාව ඇතුලෙ දී" චතුර පැවසී ය.

"මාලිගාව වුණාට ඕක හොර ගුහාවක්. ගත්ත එකා මෙලහකට පැනලා ගිහින් ඇති. යංකෝ අපි පොඩ්ඩක් බලමු" චතුරගේ මාමා පැවසීය. ඉන්පසු ඔවුන් ගොස් මාලිගාව තුළ ද ඉන් පිටත ද හැකි පමණින් පරීක්ෂා

කර බැලී ය. කාරය තුළ ද සොයා බැලීය. නමුත් සමු නොවුනි.
"අපරාදේ දහස් ගාණක් වටින ෆෝන් එක. මේ මාසෙ බජට් වෙන් කරලා ඉවරයි. ආය මට අරන් දෙන්න සල්ලිත් නෑ. මම පුතාට ලබන මාසෙ අරන් එවන්නම් හොඳ ද?" චතුරගේ මාමා කීය. චතුරට සිසිල් සුළං රැල්ලක් ඇඟෙහි වදිනු දැනුණි. චතුර වටපිට බැලී ය. ඒ අඹ ගසකින් විය. චතුරගේ පැරණි මතකය අවදි විය. චතුරගේ දෑසට සියුම් කඳුලක් නැගුණි.
"මාමේ මට ෆෝන් එකක් එපා. මට අඹ පැළයක් එවන්න" චතුර පැවසුවේ ය. එම ප්‍රකාශය සරත්ට හා අජන්තාට සතුටක් ඇති කළ මුත් චතුරගේ මාමා එයින් විස්මයට පත් විය.
"පුතා ඔයා ඔය ඇත්තම ද කියන්නේ?" චතුරගේ මාමා පුදුමයෙන් ඇසී ය.
"ඔව් මාමේ මට ෆෝන් එකක් එපා මට අඹ පැළයක් දෙන්න" චතුර ස්ථිර ලෙස පැවසීය.
"හොඳයි පුතාගෙ කැමැත්ත. මම ඕනෙ නම් මේ යන ගමන් අඹ පැළයක් අරන් දෙන්නම්" කියූ චතුරගේ මාමා කාරයට නැගුණි. චතුර ද කාරයට නැගුණෝ ය.

චතුරගේ මාමා මාර්ගයේ තිබූ පැළෑ තවානක් කාරය අසල නැවැත්වීය.
"යමු ඔයාට අඹ පැළයක් ගන්න" චතුරගේ මාමා චතුරත් සමඟින් පැළ තවානට ගියේ ය. චතුර තමාට සුපුරුදු අඹ ගසේ වර්ගයෙන් ම පැළයක් මිලට ගත්තේ ය. චතුරට එයින් තමාට හුරුපුරුදු සුවඳ හමන්නය විය. චතුරට එයින් වෙන් විය නොහැකි බව දැනුණි. චතුරට
තම වැරදි හදා ගැනීමට කාලය එළඹ තිබේ.

විය.
"මොකද මල්ලි මෙහාට යන්නේ? කොල්ලට ෆෝන් එක ආපහු හොයන්න ඕනේ කිවුව ද?" සරත් ඇසීය. චතුරට සිනහ ගියේ ය.
"නෑ ඔය පැළයක් අරන් පිටිපස්සට දැම්මේ. කැලෑ අඹ ජාතියක්" චතුරගේ මාමා කීය.
"එහෙනම් මොකට ද ඔය යන්නේ?" අජන්තා ඇසී ය.
"කෑම කන්න නුවර වැව පැත්තට යන්න බැලුවේ" චතුරගේ මාමා පැවසුවේ ය.
"අපරාදෙනේ මල්ලි කලින් ම යන්න එපැයි" සරත් කීවේ ය.
"ඒකනෙ අයියෙ මට මතක නැති වුණානෙ. ආය මේ පැත්තෙ කන්න හොඳ තැන් නෑ" චතුරගේ මාමා පැවසීය.
"හොඳයි එහෙනම් යමු" පිරිස ගොස් ආහාර ගන්නට විය. කෑම පාර්සල් දුටු නදීන්ගේ ඥාති සොයුරියගේ මුහුණ ඇඹුල් විය.
"හරි හරි දූ රෑට හොටෙල් එකෙන්" චතුරගේ මාමා තම දියණියට පැවසීය. චතුර ඇතුළු පිරිස සතුටින් ආහාර ගත්හ. චතුරට යම් කිසි සැහැල්ලු බවක් දැනෙන්නට විය. චතුර තමාට ම සිනාසුනේ ය.

❄❄❄

පිරිස චතුරගේ මාමාගේ මිතුරාගේ නිවසට පැමිණෙන විට රාත්‍රී 8 පමණ විය. ඔවුන් මෙහි පැමිණියේ නුවර ඇති විශාල හෝටලයකින් ආහාර ගෙනයි.
"පෙරහැර මෙතනට එනකොට 9 විතර වෙනවා. එතකන් ඉන්න වෙනවා" චතුරගේ මාමාගේ මිතුරා වූ නිමල් පැවසීය. ඔහු පිරිසට කෝපි හා නෙස්කැෆේ වලින්

සංග්‍රහ කළේ ය.
"අනේ මොකට මහන්සි වෙනව ද මන්දා?" චතුරගේ මාමා ඇසීය. නිමල් සිනහ වූවා පමණි. අනතුරුව පිරිසට ම බනිස් ද රැගෙන ආවේ ය.
"අනේ මන්දා මූ නම්" චතුරගේ මාමා කීය.

නිමල් පැවසුවාක් මෙන් ම රාත්‍රී 9 වන විට පෙරහැර නිවස ඉදිරියෙන් යන්නට විය. චතුරගේ ආච්චි මහ හඬින් සාදුකාර දෙන්නට විය.
"හරි එහෙනම් අපි දැන් සැණකෙලියටත් යමු" චතුරගේ මාමා කීවේ ය.

චතුර සැණකෙලියේ දී නිදහසේ විනෝද විය. චතුර ආශා කළ බොහෝ ක්‍රීඩා එහි විය. තමා නිදහස් අයෙකු බව ඔහුට සිතෙන්නට විය. අවසානයේ චතුරගේ මාමා සැමට ම අයිස් ක්‍රීම් අරන් දෙන ලදී. සියලු ළමයින්ට චොක්ලට් පෙත්ත බැගින් රැගෙන දුන්නේ ය.
"මල්ලිට නම් පිස්සු අනේ" අජන්තා පැවසීය.
චතුර තම ජීවිත යලි ඇරඹීම සඳහා ඉදිරියට ගමන් කරමින් සිටී.

# 8
# පන්සලට යාම

පොහොය දින උදෑසන ම නදීන් අවදි විය. එදින හීල් දානය හා දිවා දානය ඔවුන් විසින් භාරගෙන ඇති බැවින් ඔවුන්ට උදෑසන ම පන්සලට යාමට සිදු විය. නදීන් දතකට මැදගෙන සූදානම් විය. නදීන්ට එය වැදගත් දිනයකි. නදීන් පන්සලකට දානයක් පිළිගන්වන්නට යන්නේ පළමු වතාවටය. මෙය නදීන්ගේ උපන් දිනයට සමගාමීව සිදු කරන බැවින් නදීන්ට එහි වටිනාකම තවත් වැඩිය. නදීන් උද්‍යෝගයෙන් යුතු ව පන්සලට යාමට සූදානම් විය.

"කොල්ලා ලෑස්ති වෙලා තියෙන්නේ. හරි උනන්දුයි වගේ" සමන් සිනාසෙමින් පැවසීය.

"ඔව් ඉතින් මගෙ දවසනේ" නදීන් සිනාසෙමින් පිළිතුරු දුන්නේ ය.

"හොඳයි හොඳයි. පොඩ්ඩක් ඉන්න අපි තාම ලෑස්ති වෙලා නෑ" සමන් කීය.

"කෝ දැන් දානය?" නදීන් ඇසී ය.

"ආ ඒක ද? ඒක නුවරින් අරන් එයි. ඇයි මතක නැද්ද?" සමන් පැවසුවේ ය.

"චතුරලාත් එයි ද දන්නෑ නේද?" නදීන් බලාපොරොත්තු සහගත ලෙස පැවසීය.

"බලමු" සමන් අලස ලෙස පිළිතුරු දුන්නේ ය.

"එහෙම කියන්න එපා තාත්තේ. එයා මගෙ හොඳම යාළුවානේ" නදීන් පැවසීය.

"මම හිතන්නේ ඔයා එයාගෙ හොඳම යාළුවා නෙවෙයි"

සමන් පැවසීය.
"එයා වෙනස් වෙයි තාත්තේ. එයා එහෙම දේවල් හිතේ තියන් ඉන්න කෙනෙක් නෙවෙයි"නදීන් ස්ථිර ලෙස පැවසීය.
"එහෙම නම් ඉතින් අපි එතකන් බලමු" සමන් පිළිතුරු දුන්නේ ය. නදීන් නිහඬ විය.
"එන්න මට මේ පිරිකර ටික අහුරන්න උදවු වෙන්න" නදීන්ගේ පියා නදීන්ට කතා කළේ ය. නදීන් ගොස් පිරිකර අහුරන්නට විය.
"කාට ද තාත්තේ මේ සල්ලි?" මුදල් ඇසිරූ ලියුම් කවරයක් පෙන්වමින් නදීන් ඇසීය.
"වෙන කාට ද ඉතින්, හාමුදුරුවොන්ට ම තමා" සමන් පිළිතුරු දුන්නේ ය.
"හාමුදුරුවොන්ට මොකට ද සල්ලි?" නදීන් සමන්ගෙන් ඇසුවේ ය.
"මම කොහොම ද දන්නේ? දැන් ගියා ම අහගන්න" යැයි පිළිතුරු දුන් සමන් තම වැඩයට අවධානය යොමු කළේ ය.

නදීන්ට මෙය විශාල ප්‍රෙහේලිකාවක් විය. හාමුදුරුවන්ට කුමකට ද මුදල්? හාමුදුරුවන්ට දානයන් ද නිසියාකාරව ලැබේ. මිනිසුන්ට පන්සලට දානය දීම සඳහා විශාල තරඟක් පවතී. පිරිකර ටික ද ලැබේ. එසේ නම් කුමකට ද මුදල් අවශ්‍ය වන්නේ? මේ පිළිබඳ ව හාමුදුරුවන්ගෙන් ඇසීමට ද නොහැකි ය. ඒ එය සදාචාරාත්මක විරෝධී වන බැවිනි. චතුර සිටියා නම් ඔහුගෙන් අසාගන්නට තිබුණි. නමුත් ඔහු ද නැත. තම පියා ද ඔහුට මෙය නොපවසන්නේ වයසට එතරම් දේ නොගැළපෙන බැවිනි. නමුත් නදීන්ට ගවේෂණය කිරීමට අවශ්‍ය විය. ගමට සිදුවන දේ වැළැක්වීමට ඔහුට

අවශ්‍යව ඇත. නමුත් තනි ව එය කෙසේ කරන්න ද?
පියාගේ අදහස වූයේ ද නවීකරණායට ඉඩ දිය යුතු
බවයි. නමුත් නවීකරණය වැරදි අතකට ගමන් කරන
බව ඔහුට වැටහේ.
"පුතේ පොඩ්ඩක් ඉක්මන් කරමු ද? පරක්කු වෙනවා"
පියාගේ කටහඬත් සමඟ නදීන් යලි පිරිකර ඇසිරීම
සඳහා යොමු විය.
"හා ඉවරයි..." සමන් දිග හුස්මක් හෙළුවේ ය.
"පුතා ගිහින් අම්මට කතා කරන්න" සමන් නදීන්ට
පැවසීය. නදීන් ගොස් කාමරයෙහි සිටි තම මවට කතා
කළේ ය.
"අම්මේ තාත්තා කතා කරනවා" නදීන් තම මවට
පැවසීය.
"හා පුතේ ඉන්න මම එනවා" යැයි පවසමින් නදිනි
පිටතට පැමිණියා ය.
"හා ආව ද? මම හිතුවෙ තව වෙලා යයි කියමින්" සමන්
සමච්චලයට මෙන් ඇසී ය.
"අනේ අනේ හරි ඉක්මන්කාරයානේ. ගිහින් ලෑස්ති
වෙන්නකෝ" නදිනි සමන්ට පැවසුවා ය.
"හරි හරි ඔහොම ඉන්නකෝ" යැයි පිළිතුරු දුන් සමන්
සමන් කාමරයට ගොස් මිනිත්තු කිහිපයකින් පිටතට
පැමිණියේ ය.
"හරි ඉක්මන් නොවෑ" නදිනි පැවසුවා ය.
"යමු යමු පරක්කු වෙනවා" සමන් මාන්නයක් මවා
ගනිමින් පැවසීය.

නදීන් ඇතුළු පවුලේ අය හීල් දානය
පිළිගැන්වීම සඳහා පන්සල වෙත ළඟා විය. නදිනි සිල්
ගන්නා අය අතරට එකතු විය. නදීන් සහ සමන් විසින්
හීල් දානය පිළිගන්වන ලදී. සමන් පැවසූ වෙලාවට ම

කේටරින් ආයතනයේ වාහනය පැමිණ සිල් ගන්නා අයට ආහාර බෙදා දෙන්නට විය. අවසානයේ වාහනය නැවත පිටව ගියේ දවල් දානයට යලි පැමිණිය යුතු බැවිනි.
"මහත්තයා මම කියපු විදියට ම වැඩ ටික සිද්ධ කළානේ" දානය ගැනීමෙන් අනතුරු ව හාමුදුරුවන් සමන්ගෙන් අසනු නදීන්ට ඇසිණි.
"එහෙමයි අපෙ හාමුදුරුවනේ" සමන් පිළිතුරු දුන්නේ ය.
"කෑම ටික නම් පංකාදු පහයි. මුදලාලි මහත්තයා මම කියපු විදියට ම පිරිකර ටික හැදුවනේ?" හාමුදුරුවන් යලිත් නදීන්ගේ පියාගෙන් අසන්නට විය.
"එහෙමයි අපෙ හාමුදුරුවනේ එහෙමයි" සමන් පිළිතුරු දුන්නේ ය.
"එහෙම නම් හොඳයි" කියූ හාමුදුරුවන් වහන්සේ පවසා නිහඬ විය. සමන් වැඳ අවසර ගෙන පිට ව ගියේ ය. තමන් සිටින්නේ හාමුදුරුවන්ට අවැසි ලෙස පිරිකර ලබා දෙන යුගයක බව නදීන්ට වැටහුණේ ය.
"යමු පුතේ අපි පිරිකර පූජා කරන්න" සමන් නදීන් ද රැගෙන පිරිකර පූජා කරන්නට ගියේ ය.

මුදල් සහිත ලියුම් කවරය ගන්නා විට හාමුදුරුවන්ගේ දෑත වෙවුලනු පෙනිණි.

නදීන් සහ පියා අනතුරුව නිවස බලා ගියේ ය. යලි දවල් දානයට යා යුතු බැවින් නදීන් තම බලු පැටියා ද රැගෙන ඇවිදින්නට ගියේ ය. සුපුරුදු මඟ ගමන් කළ නදීන් යලි ආපසු ආවේ චතුරගේ නිවස අසලින් ය. නමුත් චතුරට දක්නට ලැබුණේ චතුරගේ නිවසේ කිසිවෙකු නොසිටින බව ය. නදීන් එය සිහිනයකින් වත් බලාපොරොත්තු නොවී ය. නදීන් විශ්වාස කළේ චතුර දවහල් බුද්ධ පූජාවට පැමිණෙනු

ඇති බවට ය. නමුත් එම බලාපොරොත්තුව ද දැන් විනාශ වී තිබේ.

වේලාව ගත විය. නදීන් සහ සමන් දවල් දානය සහ බුද්ධ පූජාව සඳහා පන්සල බලා පිටත් ව ගියේ ය. ඔවුන් ගොස් සුළු වේලාවකින් බුද්ධ පූජාව ආරම්භ විය. ඒ සඳහා ද අනුග්‍රාහකත්වය ලබා දුන්නේ ද සමන් විසිනි. බුද්ධ පූජාව අතරතුර නදීන්ට පාසලේ මිතුරියක් සමු විය. ඒ තාරිකා යි. තාරිකාගේ පියා ගමේ පෙදරේරුවා විය. ගමෙහි ඕනෑම පෙදරේරු වැඩක දී උදවු ලබා ගත්තේ තාරිකාගේ පියාගෙනි. නමුත් දිනක් අවාසනාවන්ත ලෙස තාරිකාගේ පියා ඉදිකරමින් සිටි නිවසක බිත්තියක් කඩා වැටීමෙන් මිය ගොස් තිබුණි.

"සමාවෙන්න තාරිකා අපිට එන්න බැරි වුණාට. අපි දැනගෙන හිටියෙ නැහැ නොවෑ" නදීන් තාරිකාගෙන් සමාව අයදින්නට විය.

"අපි ආරාධනා කරන්න ගියෙත් නැහැ නදීන්. අත්‍යවශ්‍යම අය එකතු වෙලා අවමගුල කළේ" තාරිකා පිළිතුරු දුන්නා ය.

"මට දැන් ඊටත් වඩා ලොකු ප්‍රශ්නයක් තියෙනවා. දැන් පවුලේ වගකීම් ඔක්කොම යන්නෙ මටයි අම්මටයි. ඇත්තට ම කිවුවොත්, මට බයයි" තාරිකා පැවසීය.

"තාරිකා ඔයාගෙ තාත්තගෙ සාර්ථකත්වය මෙතන තියෙනවා" අවට ඇති තාප්ප පෙන්වමින් නදීන් පැවසීය. එම තාප්ප සියල්ලම නිර්මාණය කරන ලද්දේ තාරිකාගේ පියා විසිනි. "ඔයත් ඒ සාර්ථකත්වය හොයාගෙන යන්න" නදීන් පැවසුවා ය.

තාරිකාගේ මුහුණේ සිනාවක් ඇඳෙන්නට විය. "ඔයා හරි.මම හිතන්නේ මම අඹ වගාවට යෙමු වුණා නම් හරි" තාරිකා පැවසුවා ය. නදීන් එයින් යම් කිසි

තෘප්තියක් දැනෙන්නට විය. තාරිකාගේ සිතට සතුටක් එක් කිරීම ඉතා සතුටට කාරණයක් විය. එමෙන් ම තමාට ද වඩා ප්‍රශ්න ඇති අය ලොව සිටින බව නදීන් වටහා ගත්තේ ය.

# 9
# උපන් දිනය

දවස් ගත විය. දිනෙන් දින ගත වී නදීන්ගේ උපන් දිනය උදා විය. නදීන්ගේ ඉල්ලීම පරිදි නදීන්ට අඹ ගෙඩියක් හැඩැති කේක් එකක් ගෙන එන ලදී. නදීන් තම කේක් එන පිළිබඳ ඉල්ලීමක් කළ පළමු වතාව වූ බැවින් නදීන්ගේ දෙමව්පියන් එය නොපැකිළී අරන් දුන්නාහ. දැන් උපන් දිනයට සිල්ලම සූදානම් ව තිබේ. නදිනිගේ නංගී සහ ඔහුගේ පවුල ද මේ සඳහා පැමිණ තිබුණි. සමන්ගේ පවුලේ සමන් හැර වෙන කිසිවෙකු නොවීය. දෙදෙනාගේ ම දෙමව්පියන් මිය ගොස් තිබුණි. එබැවින් මෙය කුඩා උපන්දින උත්සවයක් ව තිබුණි. වෙනදා නම් චතුර ද මෙයට සහභාගී වෙයි. නමුත් අද දින ඔහු ද නැත. නදිනිගේ නංගී ද මේ පිළිබඳව ඇසූ කළ නදිනි සිදුවීම පැවසුවා ය.
"අබුද්දස්ස කාලෙට ලබුත් තිත්තලු නේද අක්කේ" නදිනිගේ නංගී පැවසුවා ය.

නදීන්ට මෙයින් සුළු දුකක් ඇති වෙන්නට විය. නමුත් කෙදිනක හෝ චතුර වෙනස් වන බව ඔහු විශ්වාස කළේ ය.
"කාලය විසින් හෝ චතුර වෙනස් වේවි" යැයි නදීන් සිතන්නට විය.
"හරි අපි දැන් කේක් එක කපමු" සමන්ගේ හඬින් නදීන් පියවි ලොවට පිවිසියේ ය. මේ චතුර නොමැතිව නදීන් සමරන පළමු උපන්දිනයයි. එමෙන් ම උසස් පාසලට යාමට පෙර සමරන අවසන් උපන්දිනයයි. තවත් දින

කිහිපයකින් ඔහු මහනුවර උසස් පාසලක ඉගෙනුමට යයි. නදීන් තෙත් වූ දෑසින් යුතුව කේක් එක කරා ගමන් කරන්නට විය. නදීන් පිහිය අතට ගත්තේ ය. නමුත් එක්වරම,
"නදීන්..." යනුවෙන් හඬක් ඇසුණි. නදීන් එදෙස හැරී බැලුවේ ය. නදීන් ඉමහත් විස්මයට පත් විය. නදීන් පමණක් නොව එතැන සිටි සිල්ලෝ ම අතිශය විස්මයට පත් විය. ඒ වෙන කිසිවෙකුත් නොව චතුර ය. චතුර පමණක් නොව සරත්,අජන්තා මෙන් ම චතුරගේ මාමා සහ ඥාති සහෝදරිය ද එහි විය. එමෙන් ම චතුරගේ ආච්චි ද විය.
"චතුර..." නදීන් චතුර සිටි දිශාවට දිව ගියේ ය. දෙදෙනා මහත් සතුටින් වැළඳ ගත්තෝ ය. පෙර මිතුරන් දෙදෙනෙකු, තරහ වූ හොඳම යහළුවන් දෙදෙනෙකු මෙසේ එක්වර ම හමුවීම කොතරම් සොඳුරු ද? සොබාදම් මාතාව මෙවැනි මිතුරන් කිසි දිනෙක අත් නොහරී.
"මට සමාවෙන්න නදීන්. මම ෆෝන් එකක් නිසා ඔයාව අත්හැරියා. ඇත්තට ම මම කළේ හරි ම මෝඩ වැඩක්. මට ඇත්තට ම සමාවෙන්න නදීන්. මෙන්න මගෙන් ඔයාට තෑග්ගක්" ඒ චතුර විසින් මහනුවර දී මිල දී ගත් අඹ පැළයයි. චතුරගේ ප්‍රකාශය නිසා නදීන්ට ශෝකයක් දැනුණි. නදීන් අඹ පැළය අතට ගත්තේ ය.
"අර අඹ ගහේ වර්ගෙමයි නේද?" නදීන් චතුරගෙන් ඇසීය. චතුරට එයින් ප්‍රීතියක් ඇති විය. නදීන් තමා සමඟ අමනාප නොවන බව ඔහුට වැටහුණි
"ඔව්" චතුර පැවසීය.
"ගහ ගාවින් ද ගත්තේ?" නදීන් ඇසීය
"නෑ නුවරින් ගත්තේ" චතුර පිළිතුරු දුන්නේ ය.

“ඇයි නුවර ගියේ?” නදීන් ඇසීය.
“දළදා මාලිගාවට ගියේ” යනුවෙන් චතුර අමුත්තකින් යුතුව පිළිතුරු දුනි. නදීන්ට සිදුවීම වැටහුණි. නදීන් පෝය දින චතුරගේ නිවස අසලින් යන විට එහි කිසිවෙකු නොවූයේ එබැවිනි.
“පුතාලා එන්න කේක් කපන්න” සමන් චතුරට සහ නදීන්ට කතා කළේ ය. දෙදෙනාම එදෙසට ගියේ ය. දැන් නදීන් සහ චතුර හොඳ ම මිතුරන් ය. නදීන් ගොස් කේක් එක ඉදිරියෙන් සිට ගත්තේ ය. සියල්ලෝ ම නදීන්ට සුබ පතන්නට විය. නමුත් එවෙලෙහි නදීන් ඇසුණේ එක් හඬක් පමණි. ඒ තම නව මුණුපුරා වඩා ගැනීමට අතු ඉති සොලවන මහළු අඹ වෘක්ෂයේ හඬයි.

කේක් කපා අවසානයේ දී නදීන්ට ත්‍යාග පිළිගන්වන ලදි. සමන් විසින් නදීන්ට අලුත් පොත් බෑගයක් තිළිණ කරන ලදි. නදිනි විසින් චතුරට පෑන් පැන්සල් කට්ටලයක් ලබා දෙන ලදි. චතුර විසින් පොත් කිහිපයක් ද චතුරගේ මාමා අඹ ගසක අනුරුවක් ද තෑගි දෙන ලදී
“ඕක මම කොළඹින් ගෙන්නුවේ”චතුරගේ මාමා ත්‍යාගය පිළිගන්වන විය පැවසීය.
“තෑග්ගෙ වටිනාකම තියෙන්නෙ ගෙන්නුව තැන නෙවෙයි ලබන්නට තියෙන ප්‍රයෝජනය මත” යනුවෙන් නදීන් පැවසීය. නදීන්ගේ වදනින් සියල්ලෝ ම පුදුමයට පත් විය.
“ඔව්” චතුර පැවසීය.
අහ ගත්තා ඇති නේද?” සරත් චතුරගේ මාමාගෙන් ඇසීය.
“නෑ මිදි” චතුරගේ මාමා රහසින් කෙඳිරී ය.

සරත් විසින් නදීන්ට ලබා දුන්නේ පුදුම හිතෙන ත්‍යාගයකි. එනම් ජංගම දුරකතනයකි

"සරත් ඔයාට කොහෙන් ද එච්චර සල්ලි?" සමන් ඇසීය.

"මගේ නෙවෙයි ඔය සල්ලි. මෙයාගෙ" සරත් පිළිතුරු දුන්නේ චතුරගේ මාමා පෙන්වමිනි.

"මගෙ? ඒ කියන්නේ තමුසෙ මගෙන් හොරකම් කළා ද?" චතුරගේ මාමා තරහින් ඇසීය.

"අනේ නෑ" සරත් සැහැල්ලුවෙන් පිළිතුරු දුන්නේ ය.

"එහෙනම්" චතුරගේ මාමාගේ මුහුණේ මාළු නටන සෙයකි.

"ඔය චතුර පුතාගෙ ෆෝන් එක" සරත් පැවසීය.


"ඒ කියන්නෙ මගෙ ෆෝන් එක කවුරුත් හොරකම් කළේ නැද්ද?" චතුර පුදුමයෙන් ඇසීය.

"ඔවු පුතා එදා ෆෝන් එක සාක්කුවට දාගද්දි වැටුනෙ වාහනේ සීට් එකට මම ඒක එහෙමම අරගෙන ඉනේ ගහගත්තා. වාහනේට නැග ගත්තට පස්සෙ මම ඒක අම්මගෙ මල්ලට දැම්මා. ඔය ෆෝන් එක නැති වුණොත් පුතා හැදෙනවා කියලා මට තේරුණ නිසයි එහෙම කළේ. නැතුව අහිතකින් නෙවෙයි. නදීන් පුතා ඔය ෆෝන් එකට ඕන දෙයක් කරන්න. කැමති නම් චතුරට දෙන්න" සරත් කිවුවේ ය. සියල්ලෝ ම ඉන්පසු හැරුණේ නදීන් දෙසට ය. චතුරගේ ජංගම දුරකතනය ගස් අතරින් ඉහළට නොපෙනී ගියේ ය. චතුර නිහඬව සිටියේ ය.

"බොහොම හොඳයි චතුර පුතා. හැමදේම විඳ දරා ගන්න පුරුදු වෙන්න ඕනේ" සමන් කීය.

"මට අවුලක් නැහැ මාමේ. මට දැන් හොඳ යාළුවෙක් ඉන්නවනේ" චතුර පැවසුවේ ය. සියලු දෙනා චතුරට ප්‍රසංශා කරන්නට විය.

“අපි යමු ගිහිල්ලා අඹ පැළේ පැළ කරමු” චතුර කිවුවේ ය.
“යමු එහෙනම්” නදීන් පැවසී ය. දෙදෙනාම නිවසින් පිට විය.
“අර පැත්තෙන් යමු. අපෙ තාත්තා අඹ පැළ හදන්න ඉඩමක් ගත්තා” නදීන් පැවසුවේ ය. සමන් මෙම ඉඩම මිලට ගත්තේ ගියවර උපන් දිනයට ය. චතුරට ගියවර අඹ පැළය සිටුවන තෙක් සිටීමට හැකි නොවුණි. ඒ චතුරගේ ආච්චිගේ රුධිර පීඩනය වැඩි වීම නිසා යි.
“අපි වෙන තැනකට යමු” චතුර පැවසුවේ ය.
“කොහෙද?” නදීන් කුතුහලයෙන් යුතුව ඇසී ය.
“අඹ ගහ ළඟට යමු” චතුර කීය.
“අඹ ගහ ළඟට?” නදීන් පුදුමයෙන් ඇසීය.
“ඔවු අපි ගිහින් අඹ ගහේ මේ අලුත් දරුවව පැළ කරමු” චතුර කිවුවේ ය.
“මුණුපුරාව” නදීන් නිවැරදි කළේ ය. නදීන් සහ චතුර අඹ ගස දෙසට දිව ගියේ ය. අඹ ගසට මීටර තුනක් පමණ ඈතින් වළක් හාරා තිබුණි.
“කවුද මේ වළ හෑරුවේ?” නදීන් විමතියට පත් ව ඇසුවේ ය.
“මම හෑරුවේ” චතුර තමන්ව ම පෙන්වා ගනිමින් ආඩම්බරයෙන් පැවසීය. නදීන් සහ චතුර එක් ව අඹ පැළය දෑතින් ම අල්ලි සිටුවීය.
නදීන් සහ චතුරගේ මිතුදම සංකේතවත් කරන මෙම අඹ පැළය තම මහළු සීයා මෙන් සදා කල් වැජඹෙනු ඇත.



නදීන් සහ චතුරගේ මිතුදම සංකේතවත් කරන මෙම අඹ පැළය තම මහළු සීයා මෙන් සදා කල් වැජඹෙනු ඇත.

# 10
# අවසන් අඹ වාරය

විවිධ සිදුවීම් මැදින් කාලය ගලා ගියේ ය. නදීන් සහ චතුර දැන් සුපුරුදු ලෙස අඹ ගසෙහි හමුවෙති. චතුරගේ ආච්චිගෙන් කතා ඇසීමට යති. මෙම සිදුවීම් අතර ඉදිරියේ දී විශේෂ යමක් සිදුවීමට නියමිත බව ඔවුහු නොදත්තාහ. විශේෂයෙන් ම චතුර...

මහලු අඹ ගෙසෙහි ඵල බර විය. එම ඵල ඉදී කහ පැහැති විය. කුරුල්ලන් රංචු පිටින් ඵල වෙත ඇදී එන්නට විය. ගම ම එක ම වසන්තයක් බවට පත් ව තිබේ. නදීන් සිට වූ එක් අඹ ගසක ද මේ වන විට ඵලදාව හට ගෙන තිබේ. නදීන්ට වෙනදා නම් මෙය දකින විය ඇති වන්නේ බොහෝ සතුටකි. නමුත් අද එය දුකක් බවට පත් වී තිබේ. මෙය නදීන් ගමෙහි ගත කරන අවසන් අඹ වාරයයි. නදීන් තව දින කිහිපයකින් මහනුවර උසස් පාසලකට ඇතුල් වෙයි. නදීන්ට පාසලෙහි නේවාසිකාගාරයෙහි නතර වීමට සිදුව තිබේ. මෙම දින කිහිපයෙහි ම ඔවුන් කළේ නේවාසිකාගාරයට යාමට බඩු ඇහිරීමයි.

"මගෙ අප්පේ මේවාට කීයක් වියදම් වුණා ද?" සමන් ගෙන ආ තිබූ බඩු කන්දරාව දුටු නදිනි ඇසුවා ය.

"රුපියල් හත්සිය පනහයි. මේකට සත විස්සයි. ඔක්කොම හත්සිය විස්සයි සත පනහයි" තම අත වූ ටොෆියක් පෙන්වා එය කටට දා ගනිමින් සමන් කීය.

"මොකට ද ඉතිරි සත තිහ" නදිනි ඇසුවා ය.

"ඒක මුගෙ බඩේ" නදීන්ව පෙන්වමින් සමන් පිළිතුරු

දුන්නේ ය. නදීන් මඳ සිනහවක් පෑවේ ය.
"ඉඳලා හිටලා මොකුත් කෑවට කමක් නෑ. හැබැයි පුරුද්දකට ගන්න එපා" නදිනි පැවසුවා ය.
"හරි අපි දැන් අපෙ වැඩේ පටන් ගමු නේද?" සමන් නදිනිට පැවසීය. නදීන්, සමන් සහ නදිනි භාණ්ඩ පරීක්ෂා කිරීමට යොමු විය. සමන් බඩු ලැයිස්තුව අතට ගත් අතර නදිනි ට්‍රන්ක පෙට්ටිය කරා යොමු විය. නදීන් සියල්ල පරීක්ෂාවෙන් බලා සිටින්නට විය.
"පාසල් නිල ඇඳුම් තුනයි" සමන් කීය.
"එකයි... දෙකයි... තුනයි... හතරයි..." නදිනි ගණන් කළා ය. ඇඳුමක් කිලිටි වුවහොත් කියා වැඩිපුර ඇඳුමක් ද මස්සවන ලදී.
"නේවාසිකාගාරයට අඳින්න ඇඳුම් කට්ටල පහයි" සමන් කීය.
"හයයි" නදිනි කීය. එය ද කිලිටි වුවහොත් කියා වැඩිපුර එකක් දමා තිබිණි.
"නිදන ඇඳුම් දෙකයි"
"හරි"
"දත් බෙහෙත් එකයි"
"හරි"
"සපත්තු කුට්ටම් දෙකයි"
"හරි"
"සෙරෙප්පු කුට්ටමයි"
"හරි"
"අපි එහාට සෙරෙප්පු දාන්නත් ඕනෙ ද?" නදීන් ඇසීය.
"ඔව් එහාට සෙරෙප්පු, ඉස්කෝලෙ යන කොට ඉස්කෝල සපත්තු, ගමනක් යනකොට අනෙක් සපත්තු" සමන් පැහැදිලි කර දුන්නේ ය.
"කකුල් තැම්බෙයි එහෙනම්" නදීන් පැවසුවේ ය.

“එහෙ ඉතින් එහෙම තමයි. අපි දැන් වැඩේට බහිමු” සමන් පැවසීය.
“සපත්තු පොලිෂ් එකයි”
“හරි”
“බුරුසුවයි”
“හරි”
“හැඳි දෙකයි”
“හරි”
“ගෑරුප්පු දෙකයි”
“හරි”
“ලේන්සු”
“හරි”
“කෑම පෙට්ටියයි”
“හරි”
“පොත්”
“හරි”
“පෑන්”
“හරි”
“පාටකූරු”
“ඔක්කොම හරි අනේ”
“හරි එහෙනම්. ආය ඉතින් මෙට්ටෙටයි රාක්කෙටයි සල්ලි තමයි”
“තව කඩයක් දාතැහැකි මේවගෙන්” නදිනි සිනාසෙමින් කියන්නට විය.
“කොල්ලා ඉගෙන ගන්න ඕනේ ඉතින්” සමන් කීය. නදින් සිනාසී ප්‍රතිචාර දක්වන්න විය.
“අනේ ඔව් පුතා පිට පාරේ යන්න එපා” නදිනි ද කීවා ය.
“කොහෙද නදිනි ඔය පිට පාර තියෙන්නේ? මම තේ

වත්තේ වැඩට යන දවසෙත් කිවුවා නේද?" සමන් ඇසීය. සමන්ට අවශ්‍ය වූයේ මේ දවස් ටිකේ සතුටින් තියන්නට ය.

"අනේ සමන් යන්න" නදිනි සිනාසෙමින් පැවසුවා ය.

"හරි හරි... සමාවෙන්න" සමන් පැවසුවේ ය.

"පුතා එහෙනම් බුදු සරණායි කියලා නිදා ගන්න. හෙට අඹ වාරෙනේ. උදේ ම යන්න ඕනෙ නේද?" කියූ සමන් නිදාගන්නට ගියේ ය. නදීන් ද නිදන ඇඳට ගිය ද ඔහුගේ සිත තිබුණේ අඹ වාරයේ ය. වෙනදා අඹ වාරය නදීන්ට සතුටක් ගෙන දුන්න ද නදීන්ට දැන් දුකක් ඇතිව තිබේ. මේ තමන්ගේ අවසන් අඹ වාරයයි. නදීන්ගේ දෑස අගින් කඳුලු බිඳුවක් වෑස්සෙන්නට විය. නදීන් කාලයට ඉඩ දී බලා සිටින්නට තීරණ කර නිදා ගත්තේ ය.

❄❄❄

නදීන් උදෑසන ම අවදි විය. අද අඹ වාරයයි. මුළු ගමම අද දින අඹ ගහ යටට රැස්වේ මුළු ගමට ම අඹ ගෙඩි බෙදීමට මෙම විසල් අඹ වෘක්ෂය සමත් ය. ගමේ මහළු,තරුණ-ලොකු,පොඩි සැවොම අඹ කැඩීමට, අඹ කෑමට එකතු වූහ. නදීන් ද මුව සෝදාගෙන අඹ ගස වෙත යන්නට විය. අද දින නදීන්ට අඹ ගස අසලට කලින් ම යාමට වුවමනා වූ නදීන් අඹ ගස දෙසට දිව යන්නට විය. අඹ ගස අසල කිසිවෙකු නොවීය. අඹ ගස අසලට ගිය නදීන් එය තරයේ වැළඳ ගත්තේ ය. නදීන්ට සිතට මහත් වූ වේදනාවක් දැනෙන්නට විය. තමා හෙට දින මෙම අඹ ගස හැරදා යන බව ඔහුට සිහිවන්නට විය. එවෙලෙහි ම චතුර ද එම ස්ථානයට පැමිණියේ ය. එවෙලෙහි නදීන් ව වෙනත් අයෙකු දුටුවා නම් සිතන්නේ ඔහුට පිස්සුවක් වැළඳී ඇති බවයි. නමුත්

නදීන් තමා මහනුවර උසස් පාසලකට යන බව චතුරට කලින් කියා තිබුණි. එබැවින් චතුරට ඔහුගේ හැඟීම් වටහා ගත හැකි විය.
"නදීන්..." නදීන්ගේ උරහිසට අත තියමින් චතුර පැවසීය.
"ආ... නදීන්" තම දෑසෙහි වූ කඳුලු පිහදා ගනිමින් නදීන් පැවසුවේ ය.
"නදීන් අද කලින් ම ඇවිත්නේ" චතුර කීය.
"ඔව් චතුර" නදීන් පැවසීය.
"නදීන් මට කියන්න ආරංචියක් තියෙනවා" චතුර දුක්බර හඬින් පැවසීය.
"මොකද්ද?" නදීන් පුදුමයෙන් ඇසීය.
"මම හෙට කොළඹ යනවා" චතුර කීය.
"කොළඹ? ඒ මොකට ද?" නදීන් ඇසීය.
"ඉස්කෝලෙකට" චතුර පහත් හඬින් පැවසුවේ ය.
"ඒ කියන්නේ චතුර ඔයා කිවුවා වගේ ම යනවා?" නදීන් ඇසීය. චතුර තවම සම්පූර්ණයෙන් වෙනස් ව නැති බව ඔහුට සිතුණි.
"නැහැ නදීන් මට යන්න වෙනවා. මාමා මහනුවර දී අයදුම් පත්‍රය භාර දීලා. ඉතින්, මට යන්න වෙනවා" චතුර පැවසීය.
"ඒ කියන්නේ අපි දෙන්නා දෙපැත්තකට යනවා?" නදීන් ඇසීය.
"ඔව් චතුර. ඒත් මම කැමැත්තෙන් නෙවෙයි යන්නේ. ඔයාට තේරෙනවනේ" චතුර කීය.
"හරි හරි චතුර... මට තේරෙනවා" නදීන් කිවුවේ ය.

නදීන් සහ චතුර ගස මුල වාඩි විය. ඔවුන් දෙදෙනාම හෙට දින දෙපසකට වෙන් වී යාමට නියමිතය. නමුත් යලි දිනෙක ඔවුන් එක්වනු ඇති. ඔවුන්

දෙදෙනාම ඒ පිළිබඳ ව සිතා සතුටු විය. සුලු මොහොතකින් ගමේ සියල්ලෝ ම එතැනට රැස්ව අඹ කඩාගෙන කන්නට විය. නදීන් සහ චතුරට මෙහි දී තම පාසල් මිතුරියක් වන තාරිකා ද සමු විය. තාරිකා අඹ වගාව ආරම්භ කර තිබේ.

"හරි සතුටුයි තාරිකා. අපිට දැන් ආපුවහම කන්න අඹ තියෙනවා" කීවේ ය.

"ආපුවහම? ඇයි කොහෙද යන්නේ?" තාරිකා පුදුමයෙන් ඇසීය. නදීන් තාරිකාට සියල්ල පැවසුවා ය.

"එතකොට මට ආය ඔයාලව හම්බවෙන්නේ නෑ නේද?" තාරිකා පුදුමයෙන් ඇසීය.

"ඔව්..." නදීන් පැවසීය.

"හරි කමක් නෑ... එතකොට අපි අන්තිමට හම්බවෙන්නෙ අද?" තාරිකා ඇසීය.

"ඔව්" චතුර පැවසී ය.

ඔවුන් තිදෙනා එක් ව අඹ කන්නට විය. ඒ ඔවුන් තිදෙනා ම එක්ව අඹ කන අවසන් අවස්තාවයි. නදීන් ආපසු හැරී චතුරගේ නිවස දෙස බැලීය.

❄❄❄

"පුතා නැගිටින්න" මවගේ හඬින් නදීන් අවදි විය. අද නදීන් මහනුවර උසස් පාසලට යන දිනයයි. නදීන්ට යම් කිසි ප්‍රීතියක් දැනෙන්නට විය. දැන් නදීන්ට තම අනාගතය සොයා ගැනීමට මාර්ගය විවෘත ව තිබේ. නදීන් අවදි වී දත කට මැද මුව සෝදා ගත්තේ ය. ඉන්පසු තම අලුත් ම පාසල් නිල ඇඳුමක් රැගෙන ඇඳ ගත්තේ ය. අලුත් ම පාසල් සපත්තු කුට්ටම පැළඳ ගත්තේ ය. තම මව උදෑසන ම නැගිට පිසූ කිරිබත් ආහාරයට ගත්තේ ය. නදීන්ගේ දෑසින් කඳුලු බේරෙන්නට විය.

"මොකද පුතේ අඬන්නේ?" නදිනි ඇසීය. නදීන් හිස සැලීය.

නදීන් සුබ නැකතට දකුණු කකුල පෙරට තබා නිවසින් එළියට පිටවූ විගසම තමා ඉදිරියට වතුර වීදුරුවක් රැගෙන එන අයෙකු පෙනෙන්නට විය. ඒ නදිනි ය. නදීන් තෙත් වූ දෑසින් යුතුව වතුර උගුරක් පානය කළේ ය.

"මාගෙ පුතාට ජය වෙන්න ඕනේ" නදිනි පැවසුවා ය. නදීන්ගේ කඳුලු වැල් එයින් වේගවත් වන්නට විය. නදීන් එය නවතා ගන්නට උත්සාහ කළේ ය.

නදීන් පාර දිගේ ඉදිරියට ඇවිදගෙන යන්නට විය. නදීන් ගමෙන් ඈතට යන්නට සූදානම්ව බස් රථය එනතුරු මඟ බලා සිටින්නට විය. නදීන් අවසාන වතාවට අඹ ගස දෙස හැරී බැලීය. නැග එන හිරුගේ රන්වන් රැස් දහරාවෙන් අඹ ගස නැහැවෙමින් තිබුණි. ජීවිතය තමා කොතැනයට ගෙන ගියත්, මෙම අඹ සමය තමාට සෑම කල්හි ම මතක තිබෙන බව දන්න ඔහු තමාට ම සිනාසුණි.

**නිමි....**

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්